# ධමමනියාමතාවය - 3

පූජ්‍ය ඉලුකේගම අතථදස්සි සවාමීන් වහන්සේ.

(පිටකවරයේ ඇතුල්පැත්ත)

# ධම්මනියාමතාවය - 3

පටිච්චසමුප්පාදය සුත්තන්තභාජනීය සහ අභිධම්මභාජනීය
ලෙස විවරණය කෙරෙන ධර්ම සාකච්ඡා මාලාව.

**තමා තුළ අවිද්‍යාව යෙදෙන්නේ කෙසේ ද?**
**(පළමුවැනි කොටස)**

2021.02.06දින පවත්වන ලද
තෙවැනි ධර්ම දේශනාව.

***සංවිධානය : සවනට සිසිලස ජාත්‍යන්තර ධර්ම දේශනා***

***ගුවන් විදුලිය සහ සජීවී ධර්ම සාකච්ඡා මණ්ඩපය.***

පූජ්‍ය ඉලුක්කේගම අත්ථදස්සි ස්වාමීන් වහන්සේ.

# ධර්ම දානය පිණිසයි.

**පිටපත් කිරීම සහ සංස්කරණය:**
එච්.ඒ.අමරතුංග
(දුරකථනය 041 2240228)

**තාක්ෂණික දායකත්වය:**
චමිලා අමරතුංග

මෙම පොත නැවත මුද්‍රණය කර පිරිසිදු ධර්මදානයක් වශයෙන් නොමිලයේ බෙදාහැරීමට කැමැති සැදැහැවතෙක් වේ නම් දුරකථනයෙන් සංස්කාරක අමතා ඒ සඳහා අදාල දේශකයන් වහන්සේගේ අවසරය ලබා ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස**

සවනට සිසිලස ජාත්‍යන්තර ධර්ම දේශනා ගුවන් විදුලිය සහ සජීවී ධර්ම සාකච්ඡා මණ්ඩපයේ අනුග්‍රාහකත්වයෙන්

Skype තාක්ෂණය ඔස්සේ

**අකුරැස්ස, ගල්ලල,**

**ඉදිගස්හේන ආරණ්‍ය සේනාසනාධිපති,**

**පූජ්‍ය ඉලුකේගම අත්ථදස්සි ස්වාමීන් වහන්සේ,**

පටිච්චසමුප්පාදය, සුත්තන්තභාජනීය සහ අභිධම්මභාජනීය ලෙස විවරණය කෙරෙන ධර්ම සාකච්ඡා මාලාවේ

2021.02.06 දින පවත්වන ලද

තෙවැනි ධර්ම දේශනාව යි.

*තමා තුළ අවිද්‍යාව යෙදෙන්නේ කෙසේද?*

*(පළමුවැනි කොටස)*

**යන්න අරමුණු කරන ලද මෙම ධර්ම දේශනාව**
**ඉමහත් ශ්‍රද්ධාවෙන් සහ**
**ඔබ සැම කෙරෙහි උපන් කරුණාවෙන් යුතුව**
**හැකිතාක් දුරට උන්වහන්සේගේ දේශනා විලාසයෙන් ම**
ලිඛිත මාධ්‍යයෙන් සකස් කොට ඔබ අතට පිදීමකි.

සාකච්ඡාවක් ලිඛිතව සකස් කිරීමේදී, දේශනා විලාශය, වචන උච්චාරණ විලාශය, ශ්‍රවණ තත්ත්වය, කාර්මික තත්ත්වය, ආදී විවිධ ගැටලු හමුවන තැන් නිතිපතා විද්‍යමානවේ.

කෙසේ වුව ද වර්තමානයෙහි බොහෝ දෙනා නිබඳ විමසන ආයතන නිරෝධය පිළිබඳව වූ ක්‍රම වේදය

බුද්ධ දේශනාව අශ්‍රැතවත් හුදී ජනයාට පැහැදිලි කර දිමේ අරමුණෙන් අප ස්වාමිපාදයන් වහන්සේ අප කෙරෙහි අනුකම්පාවෙන් කරන ලද මෙම දේශනය හොඳින් හදාරා පරිශීලණය කොට සමාධිමත්වීමේ උත්සාහය ගන්නා මෙන් ඔබ සැමගෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිමු.

ධම්මනියාමතාවය 3

2021.02.06දින පැවැත්වූ

තෙවැනි ධර්ම දේශනාව.

***නමො තසස භගවතො අරහතො සමමා සමබුධසස.***
***නමො තසස භගවතො අරහතො සමමා සමබුධසස.***
***නමො තසස භගවතො අරහතො සමමා සමබුධසස***

***අවිජ්ජා පච්චයා භික්ඛවෙ සංඛාරා උප්පාදා වා තථාගතානං, අනුප්පාදා වා තථාගතානං ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතා ඉධපපචචයතා. තං තථාගතො අභිසම්බුජඣති, අභිසමෙති. අභිසම්බුජඣිත්වා අභිසමෙත්වා ආචිකඛති, දෙසෙති, පඤඤපෙති, පටඨපෙති, විවරති, විභජති, උතතානීකරොති. පසසථාති චාහ. අවිජජා පචචයා භිකඛවෙ සංඛාරා ඉති ඛො භිකඛවෙ යා තථ යා තථ තථා අවිතථා අනඤඤතථා ඉදපපචචයතා ති. අයං වුචචති භිකඛවෙ පටිචචසමුපපාදොති.***

ශ්‍රද්ධාවන්ත කාරුණික පින්වතුනි. අපි සුපුරුදු පරිදි ‘සවනට සිසිලස‘ දහම් මණ්ඩපය තුළ තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද අති උත්තර වූ, ඉතා ගම්භීර වූ, සියලු ලෝක සත්ත්වයාට සසරින් එතෙරවීම පිණිස පවතින, ඒ වාගේ ම ඉමක් කොණක් නො පෙනෙන, මේ සංසාර සාගරයේ ලෝක සත්ත්වයා දුකෙන් දුකට පත්වෙලා

ඉන්න, වැහිලා තියෙන හේතුව විවර කරමින් සම්මා සම්බුදුරජාණන් වහන්සේ නමකට පමණක් දේශනා කළ හැකි, ඒ ගම්භීර වූ පටිච්චසමුප්පාද දේශනා මාලාව යි, අපි සිධකරගෙන ආවේ. මුලින් අපි ආරම්භක දේශනාවක් වශයෙන් මේ පටිච්චසමුප්පාදය පිළිබඳව දේශනා කිරීමක් සිධකරා. එහි දී මේ පටිච්චසමුප්පාදය කියන්නේ මොකක් ද කියන එකත්, ඒ ඒ ධර්මයන් ප්‍රත්‍යවෙන ආකාරය, පටිච්චසමුප්පාදයේ අංග ප්‍රත්‍යවෙන ආකාරය, පිළිබඳවත් ඔබව දැනුවත් කරා.

ඊට පස්සේ අපට කතා කරන්න තියෙන්නේ ඒ ප්‍රත්‍යභාවයන් ඒ පටිච්චසමුප්පාදයේ දේශනාවට අනුගතව සිධවෙන්නේ කියන කොහොමද කියන එක යි. ඒ නිසා, යම් හේතු ධර්මයකින් නූපන් ඵල ධර්මයෝ උපදී නම්, පරම්පරා වශයෙන් අඛණ්ඩව පවතී නම්, -- පරම්පරා වශයෙන් කියලා කියන කොට ඒක නො සිඳ, නැවැත නැවැත උපදිමින්, නිරුධවෙමින් පවතී නම්-- යම් හේතු ධර්මයක් නිසා ඒකට හේතුව, ප්‍රත්‍යය කියලා කියනවා කියලා අපි ගිය සැරේ මතක් කරා. ඒ පටිච්චසමුප්පාදය හැටියට දේශනා කරලා තියෙන්නේ ඒ සංසාර ගමණට හේතුවන, ප්‍රත්‍යවන ධර්ම රාශිය තමයි කියලා අපි කතාකරා.

හේතුව, ඵලය, ප්‍රත්‍යය කියන මේ හැම එකකින් ම කියන්නේ යමක් උපදින්න හේතුවන නිදානය යි. අපි මීට පෙර දේශනාවල දී මේ පිළිබඳව යම් ප්‍රමාණයක් කතා වුණා. ධම්මට්ඨිති ඥානය කියන කොටසේ දී ත්, ඒ වාගේ ම උදයබ්බය ඥානය කියන කොටසේ දී ත් විදර්ශණාව පිළිබඳව සඳහන් කරන කොට මේ හේතු ප්‍රත්‍යය පිළිබඳව කතාවුණා. මේ උපාදාන ස්කන්ධය රූප-වේදනා-සංඥා-සංඛාර-විඥාන

කියන උපාදානස්කන්ධ උපදින හේතුව හැටියට රූපය මහණෙනි, මේ අවිද්‍යාව සංඛාරය. අවිද්‍යාව නිසා කර්ම නිසා ආහාරය නිසා ස්පර්ශය නිසා, නිබ්බත්ති ලක්ෂණ නො දැනීම නිසා හටගන්නවා කියලා උදයබ්බය ඥානයේ දී පෙන්නලා තියෙනවා.

එහෙම කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, මහණෙනි, අවිද්‍යාව සංඛාරයන්ගේ උප්පාදයට කාරණය යි, පැවැත්මට කාරණය යි, රැස්වීමට කාරණය යි, සංයෝගයට කාරණය යි, පළිබෝධයට කාරණය යි, කියලා. ***උප්පාදට්ඨිති ච, පවත්තට්ඨිති ච, ආයූහනට්ඨිති ච, සංයොගට්ඨිති ච, පළිබොධට්ඨිති ච*** කියලා. එතකොට ඒ වාගේ මේ ප්‍රත්‍යවීම තවත් ආකාරයකින් තමයි පෙන්නුවේ. එතකොට ප්‍රත්‍යවීම කියන එක ඒ ඒ ධර්මයන්ගේ ඉපදීමට කාරණය වෙනවා. ඒ වාගේ ම පැවැත්මට කාරණය වෙනවා. ***පවත්තත්ඨිති ච***, පැවැත්මට කාරණය වෙනවා. ***පළිබොධට්ඨිති ච,*** ඒ කියන්නේ ඒ ඒ ධර්මයන්ගේ පළිබෝධය පිණිස පවතිනවා, ***සංයොගට්ඨිති ච*** ඒ ඒ ධර්මයන් එකතුවීම සඳහා, එකට ඉපදීම සඳහා ප්‍රත්‍යවෙනවා. ***සංයෝගට්ඨිති ච,*** සම්ප්‍රයුක්ත වශයෙන් හෝ නිශ්‍රය වශයෙන් හෝ මේ විදියට සම්බන්ධවීමට ඒ ඒ ධර්මයෝ ප්‍රත්‍ය වෙනවා.

ඉතින් අන්න ඒ විදියට අපි මේ ප්‍රත්‍යභාවය කියන එක පිළිබඳව විවිධ ආකාරයෙන් කතා කරා.

එතකොට ඒ ප්‍රත්‍ය කියන එක මූලප්‍රත්‍යය, ආසන්නප්‍රත්‍යය, ආදී වශයෙන්, ඒ වාගේ ම උපකාරත්වය ආදී වශයෙන් විවිධාකාරයෙන් ප්‍රත්‍යවෙන බව අපි කතා කරා. ගසකට නම් බීජය මූලභාවයෙන් උපකාරවෙනවා. ඊට අමතරව ජලය, වාතය, හිරු එළිය, පොහොර, පස, පෘථිවිය මේවා තවත්

ආකාරයෙන් උපකාර කරනවා කියලා අපි සඳහන් කරා. එතකොට උපකාරත්ව ය කියන එක විවිධාකාරයෙන් වෙනවා. එකම ආකාරයට නෙවෙයි උපකාර වෙන්නේ කියන එක අපි කතා කරා. එතකොට මේ ප්‍රත්‍යය කියන එක ධර්මයේ සඳහන් වෙන්නේ කවදාවත් මේ උපදින ධර්ම එක ම ප්‍රත්‍යයෙන් උපදින්නෙ නෑ. ප්‍රත්‍ය රාශියකගේ එකතුවෙන් තමයි උපදින්නේ. එතකොට ඒ ප්‍රත්‍ය රාශියක් ප්‍රත්‍ය වෙන්නේ එකම ආකාරයකින් නොවන බව අපි කතා කළා. විවිධ ආකාරවලින් ප්‍රත්‍ය වෙනවා. ඒක අපි උපමා වලින් පෙන්නුවේ: ගසට ප්‍රත්‍ය වෙන ජලය ප්‍රත්‍යවෙන්නේ එක ආකාරයකින්. හිරු එළිය ප්‍රත්‍ය වෙන්නේ තවත් ආකාරයකින්. ඒ වගේම වාතය ප්‍රත්‍ය වෙන්නේ තවත් ආකාරයකින් කියලා අපි ඔබට ඒ විදියට කතාකරා.

ඉතින් ඒ නිසා මෙන්න මේ ප්‍රත්‍යභාවය කියන එක අපි ඒ ආකාරයෙන් කතා කරගෙන ඇවිල්ලා ඒ විදියට මේ ප්‍රත්‍යය කියන එක විවිධාකාරයෙන් ප්‍රත්‍යවෙමින් මේ ධර්මයෝ අඛණ්ඩව පැවතීමට හා නැවත නැවත පරම්පරා වශයෙන් උපදින්න හේතු වෙනවා. හේතු-ප්‍රත්‍ය වෙනවා. ඉතින් මේකෙන් අපිට මතු කරල දෙන්නේ මේ ලෝකයේ අපිට හම්බවෙන හැම ධර්මයක්ම මැවුම්කාරයෙකුගෙන් තොරව ඉබේ හටගැනීමකින් තොරව තවත් කෙනෙක් පුද්ගලයෙක් කරනවා නෙවෙයි. මෙතන මේ හේතුප්‍රත්‍ය සමවායයක්. ***ඉමස්මිං සති ඉදං හොති ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති*** කියන ධර්ම න්‍යායක් තමයි තියෙන්නේ කියලයි බුදුරජාණන්වහන්සේ දේශනා කලේ. මෙය ඇති කල්හි මෙය වේ මොහුගේ හට ගැනීමෙන් මෙය උපදී කියන මෙන්න මේ ධර්මතාවය තමයි බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙන්නේ.

එතකොට ඒක මම අර මාතෘකා කරපු ගාථාවේ තිබුණා, අපි ඒකත් නැවත මේ පටිච්චසමුප්පාදය  කතා කර ගත්තොත්.

ඒකත් අපි ගිය සැරේ කතා කරා. ***අවිජ්ජා භික්ඛවෙ සංඛාරා.*** එතකොට අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංඛාර උපදිනවා කියන ධර්මතාවය තථාගතයන් වහන්සේ නමක් ඉපදුන කල්හි ත්, නැති කල්හි ත් මේ ධර්‍මතාවය ලෝකයේ ඇත්තේය කියලා. එතකොට ඒ ධර්මතාවය තථාගතයන් වහන්සේ නමක් උඩුකුරු කරලා, විවර කරලා, ප්‍රකට කරළා, උපමා ගෙනහැර පාලා මේක තේරුම් ගන්න පුළුවන් ආකාරයට දේශනා කරනවා.

එතැන දී තව වටිනා කාරණාවක් බුදුරජාණන් වහන්සේ යටින් දේශනා කරනවා, ***ඉති ඛො භික්ඛවෙ යා තථා*** - මහණෙනි මෙසේ මේ තථ අවිතථ අණඤ්ඤතථ ඉදප්පච්චයතා ***අයං වුච්චති භික්ඛවෙ පටිච්චසමුප්පාදෙ.*** මේ තථ භාවය කියලා කියන්නේ සත්‍යභාවය යි. මේ සත්‍යය තථාගතයන් වහන්සේ නමක් ඇති කල්හිත්, නැති කල්හිත්, අනාගතයේ ත්, දැනුත්, අතීතයේ ත්, මේක කිසි කලෙකත් වෙනස් වෙන්නේ නෑ තියන ධර්‍මතාවය සිටියේ ම යි. බුදුරජාණන් වහන්සේ නමක් ***ආසභන්ඨානං පටිජානාති*** කියලා ඒ නො සෙල්වෙන තත්ත්වයකට කම්පා නො වෙන තත්ත්වයකින් දේශනා කරන්නේ මේ තුන් කාලයේ ම මේ ධර්‍මතාවය කිසි කලෙකත් වෙනස් වෙන්නේ නෑ කියන තථභාවය, සත්‍යභාවයක් තියෙනවා.

යම් දවසක අපට යම් ලෝකයේ දුකක් උපදිනවා නම් උපදින්නේ මෙහෙමයි කියන ප්‍රත්‍යක්‍ෂඥානය  කියන එක යම් දවසක හටගත්තොත් අන්න ඒ  සත්‍යය, ඒ සත්‍යය තවම අපට ප්‍රත්‍යක්ෂ වෙලා නෑ.  බුදුකෙනෙක් කෙරෙහි ශ්‍රද්ධාවෙන්

තමයි පිළිගන්නේ. මහණෙනි, සත්ත්ව පුද්ගලභාවය කියන එක බොරුවක්. මුළාවක්. මේ සත්ත්වයෙක්-පුද්ගලයෙක් කියන තැන තියෙන්නේ හුදු ස්කන්ධ සමූහයක් පමණයි. දුක කියන එක හටගන්නේ මේ හේතු ප්‍රත්‍යයෙන් මිසක්, කෙනෙක් දුක් උපද්දවනවා නෙවෙයි කියන ධර්මතාවය කොච්චර කිව්වත් අපි මේ සංසාර පුරුද්ද නිසා තව තවත් මුලා වෙවී ම දුකට පත්වෙනවා. ඉතින් ඒ නිසා යම් දවසක කෙනෙක් බණ භාවනා කරලා කෙලෙස් යටපත් කරගෙන, රූපය වේදනා සංඥා සංඛාර විඥාන කියන ධර්මතා ටික දැනගත්තොත් ප්‍රත්‍යක්ෂ කරගත්තොත් ඒ ධර්මයන් හටගන්නා හේතුව ප්‍රත්‍යක්ෂ කර ගත්තොත්, අන්න එදාට ඔහු ඒ සියලු දෘෂ්ටි බණ්ධනය කර ගන්නවා. සියලු දුක් නිමාවට පත් කරනවා.

ලෝකයේ යම් කෙලේසයක් කර්මයක් ලෝකයේ යම් දුකක් උපදිනවා නම් ඒ සියලු දුක්, කෙලෙස් අතීත, අනාගත, වර්තමාන වශයෙන් ඒ සියලු දේවල් හටගත්තේ මෙන්න මෙහෙම ධර්මතා ටිකකින්. අවිද්‍යාව නැමැති මෝඩ කම නිසාමයි මේ සංසාරයේ අපි යන්නේ කියන අවිද්‍යාව කියන එක නුවණින් අපි තේරුම්ගත්තොත් මෝඩකම කියන්නේ මොකක්ද කියලා තේරුම් ගත්තොත් අන්න එදාට ඔහුට මෝඩකමක් උපදිනකොටම, 'මේ මගේ මෝඩකම යි. අවිද්‍යාව නිසා මේ දුක හට ගත්තා නේද. අවිද්‍යාව නිසා මේ කෙළේසය උපන්නා නේද' කියලා ඔහුට ම දැකගන්න පුළුවන් වෙනවා. ඒ වගේම විද්‍යාව උපදවා ගැනීමේ දී ත්, ඒ කෙලේසය ඒ දුක නැතිවෙන බව ඔහුට ම ප්‍රත්‍යක්ෂ කරගන්න පුළුවන් වෙනවා. අන්න ඒකට තමයි යම්කිසි කෙනෙක් ධර්මය දකිනවා කියලා කියන්නේ.

මෙන්න මේ විදිහට කෙනෙක් ධර්මය දැකගන්න තාක් කල් ඔහු කවදාවත් ධර්මයේ රසය ලබන්නේ නැහැ. පොතපතේ දැනුමෙන් තමන්ගේ චින්තාමය ඥානයෙන් වටහා ගත්තාට, මේක ප්‍රායෝගික ව අපි ඒ ඒ එන කෙලේසයට, එහෙම නැත්තම් අපිට හම්බෙන ආයතන ඔස්සේ අපිට හම්බවෙන දැකීම්, ඇහීම් ඔස්සේ මේ අවිද්‍යාව කියන එක මතුකරගෙන දුරු කර ගත්තෙ නැත්නම් ඔහුට කවදාවත් දුකෙන් මිදෙන්න බෑ. ඔහුට කවදාවත් ඒ කෙලෙස් වලින් මිදෙන්න පුළුවන් කමක් නෑ. ඒ නිසා දැනගත්ත පමණකින් බැහැ. ***ජානතො පස්සතො ආසවානං ඛයං වදාමි*** කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කළේ. දන්න කෙනාට දකින කෙනාට ආශ්‍රවක්ෂය වෙනවා කියලයි බුදුරජාණන්වහන්සේ දේශනා කළේ.

ඒ නිසා ඇත්තටම අපි යම් ප්‍රමාණයකින් හරි මේ පටිච්ච සමුප්පන්න ධර්මතාවය, ඒ හේතුඵල දහම දැන ගත්තොත්, ඒක මනාකොට හරියාකාරව දැන ගත්තොත්, ඔහුට කියනවා **චූල සෝතාපන්න** යි  කියලා. සෝවාන් පුද්ගලයා කියලා කියන්නේ ඔහු ප්‍රත්‍යක්ෂ කරගත්තා. දැක්කා. අනුසය නසලා මාර්ග ඥානයකින් මේ සියලු ධර්මයෝ මේ මොහොතේ ම හටගෙන ඉතිරි නැතිව නිරුද්ධ වෙනවා කියන ධර්මතාවය සෝවාන් පුද්ගලයා තමන් ම දැක්කා. එයාට සෝවාන් පුද්ගලයෙක් කියලා කියන්නේ එහෙමයි. මේ හේතුඵල දහම අවබෝධ කර ගත්ත කෙනා.

එතකොට ඊට මෙහා කෙනා යම් ප්‍රමාණයකට චින්තාමය ඥානයෙන්, භාවනාමය ඥානයෙන්, සුතමය ඥානයෙන්, කියන ඥාන තුනම සම්පූර්ණ කරගෙන කෙනෙකුට මුළා වෙන්න පුළුවන්. නමුත් මුළාවෙනකොට ම මේ

පටිච්චසමුප්පාදය දිහා බලලා මේ අවිද්‍යාව කියන්නේ මෙන්න මේකයි, අවිද්‍යාව නිසයි මේ මුලාව හටගත්තේ කියලා සිහිකිරීම් මාත්‍රයෙන් සිහිකරන කොට ම ඔහුට අන්න ඒ මෝඩකම ගැලවිලා යනවා නම් ඔහු මේ ධර්මය තේරුම් ගත්තු කෙනෙක්. තමන්ගේ ඥානයෙන් අත්දැකපු කෙනෙක්. අන්න එයා තමයි  ධර්මරසය ලබන්නේ කියලා බුදුරජාණන් වහන්සේ අර ධම්මපදයේ උපමාවක් පෙන්නන්නෙඃ හැන්ද කොයිතරම් ව්‍යංජන හැඳිගෑවත් ඒ හැන්ද කවදාවත් මේ ව‍ැංජන රසය දකින්නෙ නෑ. දැන ගන්නේ නෑ. විඳින්නේ නෑ. මේ දිව තියෙන එකට ඉතා ස්වල්ප වූ ව‍ැංජන රසය පවා මේ දිව විසින් දැන ගන්නවා වගේ තමයි බුදුරජාණන් වහන්සේ දේශනා කළේ යම්කිසි කෙනෙක් මේ ධර්මය පුහුණු කරමින් ප්‍රායෝගිකව තමන්ගේ ජීවිතයෙන් අත් දැක්කොත් අන්න එදාට ඔහු ඒ සාන්දිට්ඨික වූ ධර්ම රසය අත්දකිනවා.

ඒ නිසා පින්වතුනි මේ කාරණාව පිළිබඳව ඔබට ප්‍රායෝගික උනන්දු භාවය ඇති වීම සඳහා මේක ඔබ දකින්න උත්සාහවත් වේවා, මේ සසර ගමන කෙටිකරගන්න කියලා, මේ ආරාධනා කිරීමක් වශයෙන් වාගේ බුදුරජාණන් වහන්සේ දේශනා කරපු සූත්‍රයක් තියෙනවා. කෙටි සූත්‍රයක් තියෙන්නේ. මේක අපි  මං ඔයිට ඉස්සෙල්ලත් මේක පිළිබඳව කතා කරල තියෙනවා **දුතිය දසබල සූත්‍රය**[1] කියලා.

මම ඔබට එක පෙන්නන්නම්. මේක ඔබ දැකලා ඇති. මේක ඔබ කියවලා ඇති. මං වරින්වර දේශනා කරා. නමුත් මේක අපිට ආපසු සිහිපත් කර ගත්තොත් වටිනවා කියලා හිතෙන පුදුමාකාර උත්සාහයක් ඇති වෙනවා. ඔබ සූත්‍රය පුලුවන්නම් පිටපත් කරලා තමන්ට නිතර පෙනෙන තැනක මේකෙ

[1] 2500 බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - සංයුත්ත නිකාය (2) 44වැනි පිටුව. 1.3.2. දුතිය දසබල සූත්‍රය.

තියෙන වැදගත් ටික පිටපත් කරලා තියා ගත්තා නං, ඒත් වටිනවා කියලා ඒ තරම් මේකේ වටිනාකමක් දැක්කා. මේකේ පෙන්නන්නේ ***දසබලසමන්නාගතො භික්ඛවෙ තථාගතො චතූහි ච වෙසාරජ්ජෙහි සමන්නාගතො ආසභං ඨානං පටිජානාති. පරිසාසු සීහනාදං නදති. බ්‍රහ්මචක්කං පවත්තෙති: ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථංගමො. ඉති වෙදනා, ඉති වෙදනාය සමුදයො, ඉති වෙදනාය අත්ථංගමො. ඉති සඤ්ඤා, ඉති සඤ්ඤාය සමුදයො, ඉති සඤ්ඤාය අත්ථංගමො. ඉති සඞ්ඛාරා, ඉති සඞ්ඛාරානං සමුදයො, ඉති සඞ්ඛාරානං අත්ථංගමො. ඉති විඤ්ඤාණං, ඉති විඤ්ඤාණස්ස සමුදයො, ඉති විඤ්ඤාණස්ස අත්ථංගමො. ඉති ඉමස්මිං සති ඉදං හොති, ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති, ඉමස්මිං අසති ඉදං න හොති, ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති*** කියලා මේ බුදුරජාණන් වහන්සේ මේ සූත්‍රය දේශනා කරන කොට ම කවරෙකු විසින්ද මේ දේශනා කරන්නේ? මේ දේශනා කරන්නේ කුමන සුදුසුකම් ලබපු කෙනෙක් ද? කියන එක අසන්නාට ශ්‍රද්ධාව විශ්වාසය පිහිටීම සඳහා දේශනා කරනවා. ***දසබලෙන සමන්නාගතො***, ඔබ දන්නවා දසබලය කියන්නේ මොකක් ද කියලා. දසබලඥාන පිළිබඳව. ඒ නිසා මම මේක විස්තර කරන්න යන්නේ නැහැ. ඒ දසබලඥාන කියන ඒවා තථාගතයන් වහන්සේ නමකට විතරයි තියෙන්නේ. ඒ ඒ තථාගතයන් වහන්සේගේ මේ සියලු සර්වඥතා ඥාණයට ඇතුළත් මේ දසබල ඥානයන්. සත්ත්වයන් පිළිබඳ සත්‍යයන්ගේ ඉන්ද්‍රිය ස්වභාවයන් පිළිබඳ ව සත්ත්වයන්ගේ කර්මය පිළිබඳව **ඨානා ඨාන කුසලය**. මෙය තිබුනොත් මෙය වෙනවා මෙය තිබ්බෙ නැත්තං මෙය වෙන්නේ නෑ කියන. ඒ වගේ ම අතීත අනාගත කර්ම සමාදානයන් පිළිබඳව, සියලු ඥාන සහිත

උතුමන් වහන්සේ නමක් දේශනා කරන්නේ. ඒ වගේම ***චතුවෙසාරජ්ජ*** සතර විශාරද භාවයට පැමිණිලා ***ආසභං ඨානං. ආසභං ඨානං*** කියලා කියන්නේ මේ ***ආසභ*** කියන ගවයා අතපය ආදී සතරෙන් මහ පොළොවේ හිටගත්තහම, ඒ ගවයාව කිසි කෙනකුට ඒ පාදය අයින් කරන්න බැහැ. ඉවත් කරන්න බෑ, එතැනින් තල්ලු කරලා හෝ කිසිම දේකින්. තමන්ගේ කැමැත්තෙන් පාද අයින් කරගෙන ගියොත් මිසක්. ඒ වාගේ මහපොළොවේ පිහිටලා ඉන්නවාලු මේ ගවයා.

ඒ වගේ තථාගතයන් වහන්සේ නමකුත් මේ ***ආසභංඨානං පටි ජානාති. පරිසාසු සීහනාදං නදති*** කියලා කියන්නේ. පිරිස් මැද සිංහනාද කරන්නේ. අර කිව් ආසභටඨාන භාවයට පත්වුනේ, නොසෙල්වෙනභාවයට පත්වුනේ. පත් වෙලා තමයි මේක දේශනා කරන්නේ. 'යමක් මම කිව්වා නම්, යම් කිසි කෙනෙක් එය නොවෙයි කියලා කියනවා නම්, දෙවියන් සහිත මරුන් සහිත ශ්‍රමණබමුණන් සහිත මේ තුන් ලෝකයේ එබඳු කෙනෙක් විද්‍යාමාන වෙන්නේ නැහැ. යම් ධර්මයක් මම දුක නැති කිරීම සඳහා දේශනා කරලා තියෙනවා නම්, ඒ දුක නැති කිරීම සඳහා යම් ආකාරයකට පිළිපැද්දාට ඒ දුක නැති වෙන්නෙ නෑ කියලා කියනවා නම්, එබඳු වූ කියන්න පුළුවන් හැකියාවක් තියෙන කෙනෙක් මෙ තුන් ලෝක ධාතුවේ ම නැහැ. මා විසින් ආශ්‍රවක්‍ෂය කරා කියලා කියනවා නම් ඔබ වහන්සේ මේ මේ ආශ්‍රව කෙලෙස් ක්‍ෂය කළේ නෑ කියලා කියනවා නම්, මා විසින් සර්වඥ භාවයට සම්මාසම්බුද්ධ භාවයට පැමිණියා කියලා කියනකොට යම් කිසි කෙනෙකු මේ මේ ධර්මයෝ ඔබ වහන්සේ අවබෝධ කරගත්තේ නැහැ කියලා කියනවා නම් එබඳු කෙනෙක් මේ තුන් ලෝකයේ විද්‍යාමානවෙන්නේ නැහැ' කියලා, අන්න ඒ

විදියේ සිංහනාදයක් කරමින් තමයි බුදුරජාණන් වහන්සේ මේ දේශනා කරන්නේ.

එතකොට උන්වහන්සේ කුමක්ද දේශනා කරේ? ***ඉති රූපං ඉති රූපසස සමුදයො ඉති රූපස්ස අත්ථඞගමො*** කියලා, මේ රූපය යි, මෙන්න රූපය කියලා අපිට මේ සත්ත්ව-පුද්ගලභාවයෙන් හම්බවෙන තැන රූපය උන්වහන්සේ මතුකරලා උඩුකුරු කරලා පෙන්නනවා. රූපය හටගන්නේ මෙන්න මෙහෙමයි කියලා උන්වහන්සේ විවර කරලා පෙන්නනවා. මතුකරලා පෙන්නනවා. රූපය හටගන්න හේතු ඔප්පු කරල පෙන්නනවා. ඒක බෑ නො කියන්න, එහෙම නොවෙයි කියන්න උන්වහන්සේ පෙන්නනවා. මේ රූපය නිරෝධවෙන්නේ මෙන්න මෙහෙම යි. මෙය නැති උනොත් මෙය නැති වෙනවා ම යි, කියන ඒ ආසභඨානය ඒ කියන්නේ ඒක පිහිටා සිටීම උන්වහන්සේ විවර කරලා පෙන්නුවා. රූපය වේදනාව සංඥාව සංඛාරය විඤ්ඤාණය කියන මේ ධර්මතා පහ ප්‍රකට කරලා උඩුකුරු කරලා පෙන්නනවා. සත්ත්වයා පුද්ගලයා කියන තැන මේ ලෝකයේ යමක් ඔබ දකිනවා නම්, අහනවා නම් එතැන තියෙන්නේ මෙන්න මේ ධර්මතා පහ පමණයි. ලෝකය හට ගත්තා කියලා කියනවා නම් මේ ධර්මතා පහේ හට ගැනීමයි. ඔබ යමක් දැක්කා කියලා කියනවා නම් ඔබ දැක්කා නෙවෙයි මම දැක්කා නෙවෙයි මම ඇහුවා නෙවෙයි මෙන්න මේ ධර්මතා පහක හටගැනීමයි. ලෝකයේ හටගත්තා කියලා කියනවා නම් මෙන්න මේ ධර්මතා පහේ හටගැනීමයි.

එතකොට අපි යම් දෙයක් දකිනකොට ඒ දකින තැන කෙනෙකුට මෙන්න මේ ස්කන්ධ පහ දකින්න පුළුවන් නම් අපිට දුකක් උපදිනකොට මේ ස්කන්ධ පහේ හටගැනීම

දකින්න පුළුවන් නම් අන්න ඒක තමයි මේ බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. අපි ලෝකයේ මම සත්ත්ව පුද්ගල භාවයෙන් ආත්මභාවයෙන් මම මගේ කියලා අස්මිමානයෙන් මේ විදිහට සලකා ගන්න දුක උපද්දවා ගෙන දුක් විඳින කෙලෙස් උපද්දවා ගන්න තැන් වල තියෙන්නෙ මෙන්න මේ ධර්මතාවයක් කියලා උන්වහන්සේ සර්වඥතා ඥාණයට පැමිණිලා මෙය දේශනා කරා. මෙය ඇති කල්හි මෙය වේ. ***ඉමස්මිං සති ඉදං හොති. ඉමසස උපපාදා ඉදං උපපජජති. ඉමසමිං අසති, ඉදං න හොති. ඉමසස නිරොධා ඉදං නිරුජඣති.*** මෙන්න මේක තමයි පින්වතුනි, බුදුරජාණන් වහන්සේ නමකගේ ආශ්චර්‍ය්‍ය දේශනාව ඒව මතුකරලා, උඩුකුරු කරල, විවර කරලා උන් වහන්සේ පෙන්නනවා. මෙය තිබුනොත් මෙය වෙනවා නේ ද කියලා උන්වහන්සේ සාක්ෂි ඇතුව අහනවා.

අපි ඒක ඉදිරියේදී කතා කරමු සූත්‍රයක් අරගෙන. **මහානිදාන සූත්‍රය** [2] උන්වහන්සේ මේ පටිච්චසමුප්පාදයට අයත් අංග ජාතිය කියන එක ඇති වෙන්නේ කොහොම ද? භව ප්‍රත්‍යයෙන් ජාතිය වෙනවා කියන එක උඩුකුරු කරළා, ප්‍රකට කරළා, මතුකරළා උන්වහන්සේ පෙන්නනවා. නෑ නො කියන්න. අපට තේරුණේ නැතිවුණත්, එය එසේ ම යි කියලා විශ්වාසය ඇතිවෙන ආකාරයට උන්වහන්සේ පෙන්නනවා **මහානිදාන සූත්‍රය** වාගේ සූත්‍රවල. මේ සූත්‍රභාජණීය කොටස කතා කරන කොට අපි ඒ වාගේ වටිනා සූත්‍ර ටිකක් අපි ඉදිරියේ දී එළියට අරගෙන කතාකරමු.

එතකොට ඒ විදියට බුදුරජාණන් වහන්සේ මේ සංසාරය පවතින සත්‍යතාවය, එය හටගන්න, ඇතිවෙන, නැතිවෙන,

---

[2] 2500 බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - දීඝනිකාය (2) – 80වැනි පිටුව. මහානිදාන සූත්‍රය.

හේතු උන්වහන්සේ මතුකරළා පෙන්නුවා. එතකොට ඒක කියන්නේ මෙබඳු උතුමන්වහන්සේනමක්. ප්‍රත්‍යක්ෂ කර ගත්තු දැකපු, සියලු දේ දන්නා වූ උතුමන් වහන්සේ නමකු යි කියන්නේ කියන තැනින් අපිට, අපිට නො තේරුණොට උන්වහන්සේ විශ්වාසය ඇතිකරනවා. යමෙක් අන්න ඒ විශ්වාසය ඇති කරගෙන මේ ධර්මයට පිවිසෙනවා නම් ඔහුට අභිවෘද්ධියක් ම යි වෙන්නේ. ඔහු වළාවෙන් මිදුණු සඳක් වාගේ පසු කල ඒ ධර්‍මය නිසා බබළනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කර තියෙනවා.

ඉතින් මෙතැන දී මම මතු කරගන්න හදන්නේ ඔබට මෙතෙකින් පටිච්චසමුප්පාදය තේරුම් කරලා දෙන්න හදනවා නෙවෙයි. මේ හේතුඵල දහම පිළිබඳව අපි අවබෝධ කරගත යුතුය, මේ සඳහා උත්සාහවත් විය යුතුයි කියන මෙන්න මේ උනන්දුවයි මම මේ සූත්‍රයෙන් ඇති කරන්න යන්නේ. එතකොට අර ඉස්සෙල්ලා කියපු මේ දුක් රාශිය, මේ පංච උපාදානස්කන්ධය ඇතිවෙන්නේ මෙහෙමයි කියලා ***ඉමස්මිං සති ඉදං හොති*** කියලා මේ දහම් න්‍යාය පෙන්නනවා. ඔබට මම කිව්වා, මේ දහම් න්‍යාය ***ඉමස්මිං සති ඉදං හොති*** මුළු පටිච්චසමුප්පාදය ම පද දෙකකින් වාක්‍ය දෙකකින් හකුළුවා කියපු අති වටිනා ම දේශනාවක්, සිංහ නාදයක් තමයි මේ ***ඉමස්මිං සති ඉදං හොති ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති*** කියන එක සමුදය පැත්තත්, නිරෝධය පැත්ත ***ඉමසමිං අසති*** මෙය නැති කල්හි මෙය නොවේ කියන ධර්මතාවය, මෙය නිරුද්ධ වීමෙන් මේ ධර්මතාවයෝ නිරුද්ධ වෙනවා. නැවත ආයේ කවදාවත් නො හටගන්නවා කර ඒක නිරුද්ධ වෙනවා කියන මෙන්න මේ සියලුම පටිච්චසමුප්පාදය හකුළුවා දේශනා කරපු ඉතා වටිනා දේශනාවක් තමයි.

එතකොට ඒ කොහොමද කියන එක මේ ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියලා ජරා මරණ දක්වා බුදුරජාණන් වහන්සේ පෙන්නනවා. මම ඒක ඔබට විස්තර කරන්න යන්නේ නැහැ. එතකොට ඒ විදිහට පෙන්නලා මෙය නිරෝධවීමෙන් අවිද්‍යා නිරෝධයෙන් සංඛාර නිරෝධ වෙනවා. සංඛාර නිරෝධයෙන් විඤ්ඤාණ නිරෝධ වෙනවා. මේ විදියට ***එවමෙතසස කෙවලසස දුකඛකඛනධසස නිරොධො හොති*** කියලා ඒ බුදුරජාණන් වහන්සේ මේ දුක නිරුද්ධ වෙන ආකාරයත් පෙන්නලා දෙනවා.

එතකොට පින්වතුනි, ඒ විදියට පෙන්නලා දුන්නායින් පස්සේ බුදුරජාණන් වහන්සේ මේ විදිහට පෙන්නලා වටිනා පණිවිඩයක් කියනවා. මෙන්න මේ ධර්මය දේශනා කරලා ඔබට මේක ප්‍රායෝගිකව යෙදෙන්න වටිනා කරුණු ටිකක් කියනවා***: එවං සවාකඛාතො හිකඛවෙ මයා ධම්මො උත්තානො විවටො පකාසිතො ඡිනනපිලොතිකො. එවං සවාකඛාතෙ ඛො හිකඛවෙ මයා ධම්මෙ උත්ථානෙ විවටෙ පකාසිතෙ ඡිනනපිලොතිකෙ අලමෙව සද්ධා පබබජිතෙන කුලපුත්තෙන විරියං ආරභිතුං:*** මහණෙනි මෙසේ මා විසින් ධර්මය මනාකොට දේශනා කරා. මේ හේතු ටික දේශනා කරා. තියෙන ඵල ධර්ම ටික දේශනා කරා. මේවා මතුකරලා පෙන්නුවා. ප්‍රකට කරන ලද්දේ ය. විවෘත කරන ලද්දේ ය. ප්‍රකාශ කරන ලද්දේ ය. සුන් වැරැහැලි ඇත්තේ ය. ඒකේ ඇතුළේ මොකුත් නැහැ. දොස් නැහැ. කසට නැහැ. ඒ වගේ අඩුපාඩු නැහැ. මුල මැද අග හැම තැනම යහපත් ආකාරයට මහණෙනි, නුඹලාට දේශනා කරා. මහණෙනි මෙසේ මා විසින් මොනවට දේශනා කරන ලද, ප්‍රකට කරන ලද, විවෘත කරන ලද, ප්‍රකාශ කරන ලද, සුන් වැරැහැලි ඇති ධර්මයේ ඇති කල්හි මෙබඳු භාග්‍යයක්, මෙබඳු අවස්ථාවක්, ඔබට

ලැබුණු කල්හි, මේ උතුම් අවස්ථාවක්, ඔබට මේ ක්ෂණ සම්පත්තියක් ලැබුණු කල්හි සැදැහෙන් පැවිදි වූ කුල පුත්‍රයන් විසින් - මෙතන කුල පුත්‍රයන් කියලා භික්ෂූන් වහන්සේලා යි අමතලා තියෙන්නේ. නමුත් මේක සිව්වනක් පිරිසට ම අදාළ දේශනාවක්.

ඒ විදිහට මේ සාසනයේ ශ්‍රාවකයන් විසින් උත්සාහ කළ යුතු යි. කෙසේ උත්සාහ කළ යුතු ද? සිරුරේ සම නහර ඇට ඒකාන්තයෙන් ඉතිරි වෙතොත් ඉතිරි වේවා. මස් ලේ වියළී ගියොත් වියළි වේවා. යම් පුරුෂ ශක්තියකින්, පුරුෂ වීර්‍යයකින්, පුරුෂ පරාක්‍රමයකින් යමක් සඳහා පැමිණිය යුතුද, එයට නො පැමිණ වීර්‍යයාගේ වීර්‍යයේ නැවැත්වීමක් නැහැ කියන චතුරංග සමන්නාගත වීර්ය වැඩීමට මෙබඳු අවස්ථාවක සුදුසු නේ ද කියලා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා, ***සද්ධා පබ්බජිතෙන කුලපුත්තෙන විරියං ආරභිතුං: කාමං තචො ච නහරූ ච අඨී ච අවසිස්සතු, සරීරෙ උපසුස්සතු මංසලොහිතං, යං තං පුරිසත්ථාමෙන පුරිසපරක්කමෙන පත්තබ්බං න තං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං භවිස්සති,*** කියලා අන්න එබඳු වීරියක් කරන්න සුදුසු යි.

ඒ නිසා පින්වතුනි මේ පටිච්ච සමුප්පාදය නැති කල්හි කොයිතරම් වීරිය කරත් ඒ වීරියෙන් වැඩක් නෑ. නමුත් මේ බුද්ධ ශාසනයත් මේ උතුම් අවස්ථාවත් ලැබිච්චි වෙලාවේ යමෙක් වීරිය නො කරයි ද, ඇත්තටම ඔහු තමන් ම අරගෙන විෂ පානය කරන්නා වාගේ, තමන් ම ආයුධයක් අරගෙන තමා විනාසයට පත්කරගන්නවා වගේ මේ උතුම් ක්ෂණ සම්පත්තිය නැතිකර ගත්තොත්. එහෙම බුදුරජාණන් වහන්සේ දේශනා කරලා, මහණෙනි, කුසීත පුද්ගල තෙමේ

පවිටු අකුසල් දහමින් ගැවසුනේ දුකසේ වෙසෙයි ***දුක්ඛං හි භික්ඛවෙ කුසීතො විහරති වොකිණ්ණො පාපකෙහි අකුසලෙහි ධම්මෙහි. මහතතඤච සදත්ථං පරිහාපෙති.*** මේ උතුම් මහත් වූ අර්ථය පිරිහාගනී. ***ආරද්ධවිරියො ච ඛො භිකඛවෙ සුඛං විහරති පවිවිත්තො පාපකෙහි අකුසලෙහි ධම්මෙහි. මහන්තඤච සදත්ථං පරිපූරෙති.*** මහණෙනි, ඇරඹූ වීරිය ඇති කෙනා සුවසේම වාසයකරනවා. ඒ විතරක් නෙවෙයි ඔහු මහත් වූ ඒ අර්ථය ද සම්පූර්ණ කර ගන්නවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරා. ***න භික්ඛවෙ, හීනෙන අගගසස පතති හොති.*** මහණෙනි, හීන වූ වීර්‍යයකින් අග්‍ර වූ දෙයක් ලබන්න බැහැ. ***අග්ගෙන ච ඛො අගගසස පතති හොති.*** අග්‍ර වූ වීර්‍යයකින්, අග්‍ර වූ උත්සාහයකින් අග්‍ර වූ සතියකින් ම යි අග්‍ර වූ දෙයක් ලබන්න පුළුවන්වෙන්නේ. ***මණ්ඩපෙයයමිදං භිකඛවෙ බ්‍රහමචරියං*** - මහණෙනි, මේ බඹසර, මේ බ්‍රහ්මචරියාව, මේ අපි කියන මේ භාවනාව මේ පිළිවෙත ***මණ්ඩපෙයයමිදං භිකඛවෙ*** මිහිරි පැනක් වගේ මුලින් මේක කයෝර වුනාට ඒ කයෝර බව අපිට භාවනාවට හිත දෙන්නෙ නැත්තේ අපේ ම කෙලෙස් නිසා යි. අපේම නීවරණ නිසා යි. යම් කිසි කෙනෙක් එය අමාරුවෙන් හරි මුලින් උත්සාහවත් වුණොත්, උත්සාහවත් වෙලා නීවරණ දුරු කර ගත්තොත් මේ භාවනාව මිහිරි පැනක්, මී වදයක්, මී පැණි වගේ, ඉතාමත් මිහිරි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කළේ. ඒ නිසා ***සත්ථා සමමුඛීභූතො*** - මහණෙනි, නුඹලාට ශාස්තෘන් වහන්සේ සම්මුඛ වෙලා තියෙන්නේ. ***තසමාතිහ භිකඛවෙ විරියං ආරභථ*** - ඒ නිසා මහණෙනි ඔබලා වීරිය කරන්න සුදුසු යි. ***අපපතතසස පතතියා*** - නො පැමිණි තැනට පත් වීම සඳහා ***අනධිගතසස අධිගමාය*** - නොලැබූ දේ ලබා ගැනීම සඳහා ***අසචඡිකතසස සචඡිකිරියාය,***

- සාක්ෂාත් නොකළ දේ සාක්ෂාත් කර ගැනීම සඳහා වීයර්‍ය අරඹවු. ***"එවං නො අයං අමහාකං පබබජජා අවඣඣා භවිසසති, සඵලා සඋද්‍රයා, යෙසං මයං පරිභඤ්ජාම චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපපචචය භෙසජජ පරාකඛාරං, තෙසං තෙ කාරා අම්හෙසු මහපඵලා භවිසසනති මහානිසංසා"ති එවං හි වො භිකඛවෙ සිකඛිතබබං.*** මගේ මේ පැවිද්ද, මේ ශ්‍රමණ භාවය එහෙම නැතිනම් අපේ මේ ශ්‍රාවකභාවය වඳ එකක් නොවේවා. අපල එකක් නොවේවා. මගේ මේ බුදුන් සරණ යෑම මනා කොට සරණ යෑමක්. අන්න ඒ සඳහා නුඹලා වීයර්‍යකරන්න උත්සාහවත්වෙන්න සුදුසු යි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කළා. ඒ වාගේ ම ***අතතතථං වා හි භිකඛවෙ සමපසසමානෙන අලමෙව අපපමාදෙන සමපාදෙතුං.*** තමන්ට හිත කැමති කෙනෙක් ඉන්නවා නම් තමාගේ යහපත කැමැති කෙනෙක් ඉන්නවා එයා අද වීරිය කරන්න සුදුසු යි. ***පරතථං වා හි භිකඛවෙ සමපසසමානෙන අලමෙව අපපමාදෙන සමපාදෙතුං. උභයතථං වා හි භිකඛවෙ සමපසසමානෙන අලමෙව අපපමාදෙන සමපාදෙතුනති.*** අනුන්ට උපකාර කරන්න අනුන්ගේ යහපතට යම් කෙනෙක් කැමති නම් ඔහු විසින් ද වීයර්‍ය කළ යුතුයි. මේ දෙපාර්ශ්වයම කැමති කෙනෙක් ඉන්නවා නම් මේ අරඹන්න වීරිය වඩන්න සුදුසුයි කියල බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

මේ නිසා මේ විදිහට බුදුරජාණන් වහන්සේ මේ දසබල සූත්‍රයේ දී අපට දේශනා කරන්නේ උත්සාහය ඇති කරගෙන මේ ධර්මය අපි මතුකරගන්න, තමන්ගේ ඥානයෙන් ප්‍රත්‍යක්ෂකරගන්න උත්සාහවත් වෙන්න කියන එක යි. ඉතින් ඒ නිසා ඔබට ඒ උනන්දුව ඇති කිරීම සඳහා, ඒ මම නිතර නිතර ආවර්ජනය කරන සූත්‍රයක්. ඒක බොහෝම වටිනා

සූත්‍රයක් නිසා ඔබට මතක් කළේ. මෙය නැවත නැවත ඔබ ආවර්ජනය කර ගනිමින් දවස හිස් නොවෙන විදියට ඒ භාවනාව සඳහා නියමිත කාලයක් යොදා ගෙන ඔබ භාවනා කරන්න. මොකද මේ පටිච්චසමුප්පාදය අපි කොයි තරම් අග ඉඳන් මුලට මුල ඉඳන් අගට අටුවා ටීකා ආදී කොයි දේ වුනත් අපි මේක පොත පතෙන් හොයන්න ගියාට ඔබට කවදාවත් මේක තේරුම් ගන්න පුළුවන්කමක් නැහැ.

එනිසා යම් කිසි කෙනෙක් භාවනාවෙන් නීවරණ දුරු කරගත්තායින් පස්සේ ඔබටම තේරෙනවා මේ ධර්මතා අනේ මෙහෙම නේද හට ගන්නේ කියලා. ඒ කාරණා ඔබටම තේරෙයි. එදාට ඔබට ලැබෙන නිරාමිස ප්‍රීතිය සතුට සොම්නස ඔබට මේ භෞතික කාම ලෝකයෙන් කිසි කලකත් ලබන්න පුළුවන්කමක් නැහැ. එදාට, මේ දහම් පැන, මේ මිහිරි පැන යම් කිසි කෙනෙක් පානය කළායින් පස්සේ, ඔබව බලෙන් කාමයට ඇදලා ගන්න හැදුවත්, මේ ධන ධාන්‍ය වස්තු දෙනවා කියලා කොයි තරම් පැවැරුවත්, ඔබ කවදාවත් ඒ කාමයට යන්නෙ නෑ.

ඉතින් අන්න ඒ නිසා ඔබ ඒ සඳහා උත්සාහවත් වෙන්න. එදාට මේ පටිච්චසමුප්පාදය නිරවුල්ව තේරෙයි. එදා බුදුරජාණන් වහන්සේ අභියස, ආනන්ද ස්වාමීන් වහන්සේ මතක් කළේ ඒකයි. මට මේ පටිච්චසමුප්පාදය පහසුවෙන් වැටහෙනවා. නිකම් සරල එකක් වගේ වැටහෙනවා. ඇයි, සෝවාන් වුණායින් පස්සේ උන්වහන්සේලා වීයර්‍ය කරපු නිසා මේක ප්‍රකටවෙලා තමන්ට ම පේනවා. එතෙක් පින්වතුනි, මේක අපිට ප්‍රකට වෙන්නේ නෑ. ඔබ උත්සාහ කළ දවසට ඒක දවසට ඒක ප්‍රකටවෙනවා.

ඉතින්  ඒ නිසා හොඳයි අපි අපේ මූලික දේශනාවට යමු. එතනදී අපි මේ පටිච්චසමුප්පාදය පිළිබඳව බුදුරජාණන් වහන්සේගේ දේශනා විලාසයන් ටිකක් තියෙනවා. ඒ ටිකක් කතා කරගෙන ම අපි ඒ පටිච්චසමුප්පාදයට හාත්පස කතා කරගෙන යන්ඩ අපි කතාකරගත්තා. මේක කාලය සීමාවක් කරගන්නේ නැතුව, මොකද මේ හැම මේ දේශනාවකින් ම මම උත්සාහවත් කරන්නේ ඔබට මේ හුදු පොතේ දැනුමක්, ඔබට තවත් වචන ටිකක් කියනවා වෙනුවට මේක ඔබට මේ ජීවිතයට තේරුම් ගන්න පුළුවන් ආකාරය උනන්දුව භාවනාවට ප්‍රායෝගිකත්වයට උනන්දුව ඇති වෙන ආකාරයට දේශනා කරන්න ඕන හින්දා තමයි, යම් යම් සූත්‍ර දේවල් මේ බාහිර කරුණු ත්, මේකට මම එකතු කර කර, මේ දේශනාව මේ යන්නේ. නැත්තන් අපිට මේක පටිච්චසමුප්පාදය දේශනා කරනවා කියලා අංග ටික අරගෙන අවිද්‍යාව කියන්නේ මේක යි.  අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංඛාර උපදින්නේ මෙහෙමයි කියලා මෙය ඔය දේශනා වාර දෙකකින් තුනකින් මේක ඉවර කරල දාන්න පුළුවන්.

ඒ නිසා අපි මේකේ මේ බාහිර කාරණා කියන්නේ මේකට අදාළ තොරතුරු ටිකක් මේ අට්ඨකතාවේ තියෙනවා. අට්ඨකතාව උන්වහන්සේ පටන්ගන්න කොට ම මේ විදියේ ප්‍රකාශයක් කරනවා. ***ඉදානි තදනන්තරෙ පටිච්චසමුප්පාද විභඞ්ගෙ යා "අයං අවිජ්ජා පච්චයා සංඛාරා"ති ආදිනා*** මේ පටිච්චසමුප්පාද විභඞ්ගයේ සඳහන් කරළා තියෙන  මේ ***අවිජ්ජා පච්චයා සංඛාරා*** කියන, මේ කියන ලද දේ වර්ණනා කරන්න යන්නේ කියලා ***නයෙන තන්හි නික්ඛිත්තා තස්සා අත්ථසංවණ්ණනං කරොන්තෙන*** ඒ සඳහා අත්ථ වර්ණනා කරන්නේ ***විභජ්ජවාදීමණ්ඩලං ඔතරිත්වා*** විභජ්ජවාදී මණ්ඩලයට බැසගෙන බුදුරජාණන් වහන්සේගේ දේශනාව

මැදුම් පිළිවෙත මධ්‍යමප්‍රතිපදාව අන්න ඒකටයි මේ විභජ්ජවාදී මණ්ඩලයේ කියන්නේ. ***ආචරියෙ අනබ්භාචික්ඛන්තෙන*** - ඒ ආචාර්‍යයන් නො ඉක්මවා මේ වෙනුවෙන් අතීතයේ දේශනා කරල තියන මහ රහතන් වහන්සේලා ගේ ඒ අදහස නො ඉක්මවා ***සකසමයං අවොක්කමන්තෙන*** මේ සකසමෙ කියන්නේ ස්වසමයේ ථේරවාදී අදහසට විරුද්ධ නො වී ***පරසමයං අනායූහන්තෙන*** පරසමයේ විරුද්ධ අදහස් දුරුකරළා ***සුත්තං අප්පටිබාහන්තෙන විනයං අනුලොමෙන්තෙන මහාපදෙසෙ ඔලොකෙන්තෙන ධම්මං දීපෙන්තෙන අත්ථං සඞ්ගහන්තෙන තමෙවත්ථං පුන ආවත්තෙත්වා අපරෙහිපි පරියායෙහි නිද්දිසන්තෙන ච යස්මා අත්ථසංවණ්ණනා කාතබ්බා හොති*** මේ අට්ඨකතාචාර්‍යයන් වහන්සේ දේශනා කරනවා මේ ආචාර්‍යයන් නො ඉක්මවා, ථෙරවාදී අදහස නො ඉක්මවා, සූත්‍රය, ඒ වාගේ ම විනය, ඒ වාගේ ම හේතු-ඵල දහමට බැස ගනිමින් මහාපදේශයන්, බුදුරජාණන් වහන්සේ දේශනා කරළා තියෙන මහාපදේශයන්ට බැසගනිමින් මේ අර්ථ වර්ණනා කරනවා කියලා උන්වහන්සේ මේ අට්ඨකතාව දේශනා කරලා තියෙන්නේ.

එතකොට බුදුරජාණන් වහන්සේගේ දේශනා විලාසයන් පිළිබඳව මේ පටිච්චසමුප්පාදයේ දේශනා කරලා තියෙන්නෙ කොහොමද කියන එකත් අපි තේරුම්ගත යුතු යි. ඒක තමයි මේ අට්ඨකතාවෙන් මතු කරන්නේ. ***තත්ථ 'දෙසනාභෙදො'ති භගවතො හි වල්ලිහාරකානං චතුන්නං පුරිසානං වල්ලිගහණං විය ආදිතො වා මජ්ඣතො වා පට්ඨාය යාව පරියොසානං, තථා පරියොසානතොවා මජ්ඣතොවා පට්ඨාය යාව ආදිති චතුබ්බිධා පටිච්චසමුප්පාදදෙසනා*** කියලා මෙතැන දී බුදුරජාණන් වහන්සේ මේ උපමාවක් පෙන්නනවා

යම්සේ වැල් අදින, වැල් ඇදලා මේ මේ වේවැල් ඇදලා කූඩා ආදිය වියලා ජීවත්වෙන පුරුෂයින් හතරදෙනෙක් කැලයට වැල් අදින්න ගියහම, ***චතුන්නං පුරිසානං වල්ලිගහණං විය*** ඒ පුරුෂයන් සතර දෙනාට මේ වැල් අහුවෙන ක්‍රම හතරක් තියෙනවා. ඇතැම් අයට වැලේ අග අහුවෙනවා. ඇතැම් අයට මැද අහුවෙනවා ඇතැම් අයට මුල අහුවෙනවා. මේ විදිහට ඒ වගේම මේ විදිහට අට්ඨකතාචාරීන්වහන්සේ උපමාවක් පෙන්නනවා අන්න ඒ විදියට ඒ කියන්නේ ***යථා හි වල්ලිහාරකෙසු චතූසු පුරිසෙසු එකො වල්ලියා මූලමෙව පඨමං පස්සති*** - ඇතැම් කෙනෙකුට වැලේ මුල අහුවෙනවා ලු. ඒ වගේ ඒ මුල අහුවුණායින් පස්සේ මුල පටන් අග දක්වා වැල කඩාගෙන ඇවිල්ලා කර්මාන්තයේ යොදනවා. ඒ විදිහට ***සො තං මූලෙ ඡෙත්වා සබ්බං ආකඩ්ඪිත්වා ආදාය කම්මෙ උපනෙති.*** ඒ විදිහට මුල ඉඳන් ගිහිල්ලා අග දක්වා ගිහිල්ලා වැල අරන් කර්මයේ යොදනවා. ***එවං භගවා "ඉති ඛො භික්ඛවෙ අවිජ්ජා පච්චයා සංඛාරා -පෙ- ජාතිපච්චයා ජරාමරණ'න්ති ආදිනො*** (ම.නි. 1.402) ***පට්ඨාය යාව පරියොසානාපි පටිච්චසමුප්පාදං දෙසෙති.*** කියලා ඒ විදියට බුදුරජාණන් වහන්සේ ඇතැම් වෙලාවට මේ මජ්ඣිම නිකායේ ඒ වගේම තවත් සංයුත්ත නිකාය සූත්‍රවල පෙන්නනවා, ඇතැම් වෙලාවට මේ පටිච්චසමුප්පාදය උන්වහන්සේ මුල ඉඳන් දේශනා කරනවා. අවිද්‍යාවේ ඉඳන් සංඛාර දක්වා දේශනා කරනවා. ඒ වගේම ඇතැම් වෙලාවට හරියට ***යථා පන තෙසු එකො වල්ලියා මජ්ඣං පඨමං පස්සති.*** ඇතැම් කෙනෙකුට මේ වැල් හොයාගෙන මේ වැලේ මැද අහුවෙනවා ලු. ඊට පස්සේ මැද අහුවුණායින් පස්සේ ***සො මජ්ඣෙ ඡින්දිත්වා උපරිභාගංයෙව ආකඩ්ඪිත්වා ආදාය කම්මෙ උපනෙති*** ඊට පස්සේ මැද අහුවුණායින්

පස්සේ  මැද ඉඳන් උඩට ගිහිල්ලා  ඒ කඩාගෙන ඇවිල්ලා කර්මාන්තයේ යොදනවා.

එතකොට එතැන පෙන්නනවා ඒ විදිහට ඇතැම් විට බුදුරජාණන් වහන්සේ පටිච්චසමුප්පාදයේ මැදින් පටන්ගන්නවා. අර වැලේ මැද අහුවෙලා උඩට යනවා වාගේ ඇතැම් වෙලාවට බුදුරජාණන් වහන්සේ මේ විදියට මේ උන්වහන්සේ දේශනා කරපු දේශනා යි. ***එවං භගවා තස්ස තං වෙදනං අභිනන්දතො අභිවදතො අජ්ඣොසාය තිට්ඨතො උප්පජ්ජති නන්දි. යා වෙදනාසු නන්දි තදුපාදානං තස්සුපාදානපච්චයා භවො භව පච්චයා ජාති"ති*** (මනි 1.409 සංනි3.5) ***ජාති පච්චයා ජරා මරණං*** කියලා මේ විදිහට වේදනාවෙන් පටන් අරගෙන. ඒකත් මජ්ඣිම නිකායේ සංයුත්ත නිකායේ තියෙන සූත්‍ර උපමාවක් වශයෙන් අටඨකතාචාරීන් වහන්සේ දේශනා කළා. එතකොට ඇතැම් වෙලාවක බුදුරජාණන් වහන්සේ මැදින් පටන්ගෙන ඒ පෙන්නලා තියෙන වේදනාවෙන් පටන්ගෙන, මේ වේදනාවට උපාදානය ඇති වෙලා තණ්හාව උපාදානය ඇති වෙලා ජාති ජරා මරණ ඇති වෙනවා කියලා මේ පටිච්චසමුප්පාදයේ මැදින් අරගෙන අග දක්වා දේශනා කළා.

ඒ වාගේ අපටත් මේ අපේ බණ භාවනා කරන කොට කෙනෙක් භාවනාවෙන් දියුණු වෙච්චි කෙනෙක් මේ පටිච්චසමුප්පාදය බලන කොට වේදනාවක් උපදිනවා. අන්න ඒ  වේදනාව උපදිනකොට පටිච්චසමුප්පාදය බලන කෙනා මුලට යන්න අවශ්‍ය නෑ. එතැන ඉඳන් තමන්ට වැටහෙන ආකාරයෙන් යන්න පුළුවන්. වේදනාව උපදින කොට ඔහුට බලන්න පුළුවන් මේ වේදනාව ඉපදුණා. මේ වේදනාව මම කියල මගේ කියලා ගත්තොත් මේ වේදනාවට ආසාකරොත්,

මේ වේදනාවට තණ්හා කරොත්, උපාදානය ඇති වෙනවා නේද. ඒ වේදනාව නිසා උපාදානය ඇති වෙලා භවය ඇතිවෙලා කර්‍මය ඇතිවෙලා ජාති ජරා මරණ දුක් විඳින්න වෙනවා නේද. අනන්ත ජාති සංසාරයේ දුක් විඳින්න වුණේ මෙන්න මේ වේදනාවට තණ්හා කරපු නිසා නේද කියලා, අන්න යම් කිසි කෙනෙක් වේදනාව මතු වෙන කොට එතන ඉඳන් පටිච්චසමුප්පාදය බලන්න. අන්න ඒ විදිහට මේ කොයි තැනින් ගත්තත් අපට මේ පටිච්චසමුප්පාදය තුළ හැසිරෙන්න පුළුවන් ආකාරයට බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා. ඒ වගේම ***යථාච තෙසු පුරිසෙසු එකො වල්ලියා අග්ගං පඨමං පස්සති*** ඇතැම් වැල් අදින පුරුෂයකුට වැලේ අග අහුවෙනවා ලු. ***සො අග්ගෙ ගහෙත්වා අග්ගානුසාරෙන යාව මූලා සබ්බං ආදාය කම්මෙ උපනෙති*** ඒ විදියට අග අල්ලගෙන මුල දක්වා වැල් හොයාගෙන ගිහිල්ලා කඩලා කර්මාන්තයේ යොදනවා. ***එවං භගවා "ජාති පච්චයා ජරා මරණන්ති ඉති ඛො පනෙතං වුත්තං, ජාති පච්චයා නු ඛො භික්ඛවෙ ජරා මරණං නො වා කථං වා එත්ත හොතී"ති?*** කියලා මේ විදිහට බුදුරජාණන් වහන්සේ ඇතැම් වෙලාවට අගින් පටන් අරගෙන සංයුත්ත නිකායේ මජ්ඣිම නිකායේ ඒ වාගේම මහා නිධාන සූත්‍රය වගේ ගත්තහම ඒ වගේම නිධාන සූත්‍රය බුද්ධ වග්ගය වගේ ගත්තහම ජාතියෙන් පටන්අරගෙන, ***"ජාති පච්චයා, භන්තෙ, ජරාමරණං; එවං නො එත්ථ හොති - ජාති පච්චයා ජරාමරණ"න්ති. භවපච්චයා ජාති -පෙ- අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති ඉති ඛො පනෙතං වුත්තං, අවිජ්ජා පච්චයා නු ඛො භික්ඛවෙ සඞ්ඛාරා නො වා කථං වා එත්ථ හොතී"ති? අවිජ්ජා පච්චයා භන්තෙ සඞ්ඛාරා; එවං නො එත්ථ හොති - අවිජ්ජාපච්චයා සඞ්ඛාරාති පරියොසානතො පට්ඨාය යාව ආදිතොපි පටිච්චසමුප්පාදා***

***දෙසෙති.*** මහණෙනි මේ ලෝක සත්ත්වයා නොයෙක් දුක් විඳිනවා. ජරා මරණයට පත්වෙනවා. නැවත උපදිනවා දිරනවා. මේකට හේතුව මොකක්ද මහණෙනි ඉපදීම යි. ඉපදීමට හේතුව මොකක්ද භවයයි කියලා අගින් පටන් ගෙන මුල දක්වා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඒ විදිහට ඒවාගේම ***යථා පන තෙසු පුරිසෙසු එකො වල්ලියා මජ්ඣමෙව පඨමං පස්සති. සො මජ්ඣෙ ඡින්දිත්වා හෙට්ඨා ඔතරන්තො යාව මූලා ආදාය කම්මෙ උපනෙති*** ඇතැම් කෙනෙකුට මැදින් අහුවෙලා මැද ඉඳන් මුලට යනවා. මැද ඉඳන් අගට යනවා. එතකොට ඒ විදිහට බුදුරජාණන්වහන්සේ ***එවං භගවා "ඉමෙ භික්ඛවෙ චත්තාරො ආහාරා කිං නිදානා, කිං සමුදයා කිං ජාතිකා, කිං පභවා? ඉමෙ චත්තාරො ආහාරා තණ්හානිදානා, තණ්හාසමුදයා, තණ්හාජාතිකා, තණ්හාපභවා තණ්හා චායං භික්ඛවෙ කිං නිදානා? වෙදනා, ඵස්සො, සළායතනං, නාමරූපං, විඤ්ඤාණං. සඞ්ඛාරා කිං නිදානං -පෙ- සඞ්ඛාරා අවිජ්ජානිදානා, අවිජ්ජාසමුදයා, අවිජ්ජාජාතිකා, අවිජ්ජාපභවා"ති*** (සංනි2.11) ***මජ්ඣතො පට්ඨාය යාව ආදිතො දෙසෙති.*** කියලා මේ විදිහට මහණෙනි, වේදනාවට කුමක් හේතුවේ ද? ස්පර්ශයයි. ස්පර්ශයට කුමක්ද හේතුව? සළායතනයයි. ඒවට හේතුව මොකක්ද නාමරූප යි. නාමරූපවලට හේතුව විඤ්ඤාණය යි කියලා ඇතැම් වෙලාවට බුදුරජාණන් වහන්සේ මැදින් පටන් අරගෙන උඩට යනවා. මේ **ආහාර සූත්‍රය**[3] වගේ මේ සංයුත්ත නිකායේ නිදාන සංයුත්තයේ තියෙන ඇතැම් වෙලාවට බුදුරජාණන් වහන්සේ පටිච්චසමුප්පාදයේ මැදින් අරගෙන අවසානය දක්වා යනවා.

---

[3] බුද්ධ ජයන්ති ත්‍රිපිටකය - සංයුත්ත නිකාය - (5 – 1) 246වැනි පිටුව.

මේ විදියට බුදුරජාණන් වහන්සේ මේ දේශනාවන් විවිධාකාරයෙන් දේශනා කරනවා. ***කස්මා පනෙවං දෙසෙතීති? පටිච්චසමුප්පාදස්ස සමන්තභද්දකත්තා සයඤ්ච දෙසනාවිලාසප්පත්තත්තා සමන්තභද්දකො හි පටිච්චසමුප්පාදො තතො තතො ඤායප්පටිවෙධාය සංවත්තතියෙව දෙසනාවිලාසප්පත්තො ච භගවා චතුවෙසාරජ්ජප්පපටිසම්භිදායොගෙන චතුබ්බිධගම්භීරභාවප්පත්තියා ච. සො දෙසනාවිලාසප්පත්තත්තා නානානයෙහෙව ධම්මං දෙසෙති. විසෙසතො පනස්ස යා ආදිතො පට්ඨාය අනුලොමදෙසනා, සා පවත්තිකාරණවාභාගසම්මූල්හං වෙනෙය්‍යජනං සමනුපස්සතො යථාසකෙහි කාරණෙහි පවත්තිසන්දස්සනත්ථං උප්පත්තික්කමසන්දස්සනත්ථඤ්ච පවත්තිතානි ඤාතබ්බා.*** ඇයි ඒ විදියට දේශනා කරන්නේ? මේ පටිච්චසමුප්පාදය ඉතා ම සොඳුරු යි. ඉතා ම අලංකාරය යි. කොයි තැනින් පටන්ගත්තත්, ඔහුට මේ පටිච්චසමුප්පාදය බලන්න පුළුවන්. කෙනෙකුට ජාතියෙන් පටන්අරගෙන, කෙනෙකුට භවයෙන් පටන්අරගෙන, කෙනෙකුට නාමරූපවලින්, කෙනෙකුට විඤ්ඤාණයෙන් පටන්ගෙන, චක්‍රයක් නිසා මේක කොතනින් පටන් ගත්තත් ඔහුට ඒ චක්‍රය සම්පූර්ණ කරන්න මේ හේතුඵල දහම විස්තර කරගන්න පුලුවන් නිසා හාත්පස මේ පටිච්චසමුප්පාදය සොඳුරු බව නිසාත් ඒ වගේම බුදුරජාණන් වහන්සේගේ දේශනා විලාසයත් ඇතැම් අයගේ ඒ ඒ කෙලෙස් ඉන්ද්‍රිය ස්වභාවයන් දැකලා, උන්වහන්සේ ඒ ඒ තැනින් පටිච්චසමුප්පාදය අරගෙන දේශනා කරනවා කියලා මේ අට්ඨකථාවේ සඳහන් කරනවා.

බුදුරජාණන් වහන්සේ මේ තවත් අදහසක් පෙන්නනවා, බුදුරජාණන් වහන්සේ මුල ඉඳන් අග දක්වා, අවිද්‍යාවේ ඉඳන් සංඛාරය දක්වා දේශනා කරන්නේ ඇතැම් සත්ත්වයෝ ඉන්නවා අවිද්‍යාවෙන් වැහිලා අන්ධකාරයෙන් වැහිලා මෝඩකමින් වැහිලා, සමහරවිට දෘෂ්ඨි අරගෙන, විශේෂයෙන් ඒ දෘෂ්ඨි ගත්ත අයට දෘෂ්ටි ඛණ්ඩනය කිරීම සඳහා උන්වහන්සේ මේ අවිද්‍යාව මුල් කරළා, අවිද්‍යාව ප්‍රකට කරලා පෙන්නලා මේ උපත දක්වා, ජරා-මරණ දක්වා දේශනා කරනවා. ඇතැම් අවස්ථාවල බුදුරජාණන් වහන්සේට අවශ්‍ය වෙනවා මේ දුකින් පීඩා විඳිමින් ජාතියෙන් ජරා මරණයෙන් දුක් විඳිනවා මෙයාල මිදෙන්න ක්‍රමයක් දන්නෙ නෑ. එබඳු අයට අනුකම්පා පිණිස බුදුරජාණන් වහන්සේ ඒ ජාතිය ජරා මරණ මතු කරල දීලා, එතන ඉදන් මහණෙනි මේ ජරා මරණවලට හේතුව මොකක්ද කියලා අග ඉඳන් මුල දක්වා දේශනා කරනවා. ඒ ඒ පුද්ගලයන්ගේ ස්වභාවය බලලා, බුදුරජාණන් වහන්සේ ඒ විදියේ දේශනා කරනවා.

ඒ වාගේ ම බුදුරජාණන් වහන්සේ මේ දේශනා කරන කොට, ඒ දේශනාව ඇතැම් වෙලාවට දැන් පටිච්චසමුප්පාදයේ අපි ගොඩාක් දන්නෙ මේ අවිජ්ජාව මුල්කරගෙන දේශනා කළා කියලා යි. දැන් පටිච්චසමුප්පාදය ගත්තහම චක්‍රයක්. නමුත් මේ චක්‍රය කොහෙන් හරි පටන්ගන්න ඕන. ඒ නිසා බුදුරජාණන් වහන්සේ තුන් භවයේ ම ඉන්න සත්ත්වයන්ට අවිද්‍යාව කියන එක මුල් වෙන නිසා උන්වහන්සේ අවිද්‍යාවෙන් පටන් ගත්තා. හැබැයි අවිද්‍යාවෙන් පටන් ගත්තහම මේක අවිද්‍යාවට හේතුව මොකක්ද කියන එක, එතකොට කෙනෙක් හිතන්න පුළුවන් අවිද්‍යාවෙන් පටන් ගන්නකොට අවිද්‍යාව කොහොමද ඉපදුනේ? ඒකට කාරණය

මොකක් ද? ඒක ඉබේ හටගත්තා ද? නෑ. උන්වහන්සේ මේ ධර්මතා පැහැදිලි කරලා දෙන්ඩ අවිද්‍යාව එළියටගත්තා.

නමුත් අවිද්‍යාවට ද මහණෙනි, ආශ්‍රව හේතු වෙනවා. ආශ්‍රව නිසා අවිද්‍යාව උපදිනවා කියලා උන්වහන්සේ මේ භවචක්‍රය පෙන්නනවා. දැන් අපට ඇතැම් වෙලාවල්වලට මෝඩකම කියන එක ඉබේ හටගන්නේ නැහැ. මෝඩකම කියන එක සංසාරයේ අපි අරගෙන ආපු නිසා. ඒක පුරුදුවෙච්ච නිසා, ඇසට රූපයක් ගැටෙන කොට ඒ විදියට බලලා, වැරැදි විදියට බලලා, බලලා, හුරුව, මේ ආශ්‍රවය නිසා ඇසට රූප, ශබ්ද ගැටෙන කොට අර හුරුව නිසා මුලාව ඉබේ ම, ඉබේ ම නෙවෙයි, හුරුව නිසා  හටගන්නවා. මේ නිසා මහණෙනි අවිද්‍යාවට හේතුව ආශ්‍රව යි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

එතකොට ඒ විදියට බුදුරජාණන් වහන්සේ ඇතැම් වෙලාවට අවිද්‍යාව මුල්කරගෙන දේශනා කරනවා. ඇතැම් වෙලාවට තණ්හාව මුල්කරගෙන දේශනා කරනවා. ඒ නිසා මේ අටඨකතාවේ කියනවා,  බුදුරජාණන් වහන්සේ දේශනා කරන කොට ධර්‍මතා දෙකක් මුල්කරගෙන දේශනා කරා - අවිද්‍යාව හා භව තණ්හාව කියන දෙක. මේ කාරණාවන්  දෙක මුල් කරගෙන තමයි බුදුරජාණන් වහන්සේ දේශනාවන් පැවැත්තුවේ කියලා දේශනා කරනවා. එතකොට අවිද්‍යාව මුල් කරගෙන බුදුරජාණන් වහන්සේ දේශනාවන් පැවැත්වූවේ අර විදියට මුලා වෙලා ඉන්න දෘෂ්ඨි ගත්ත, ඒ දෘෂ්ටි ඛණ්ඩනය කිරීම සඳහා මේ අවිද්‍යාව මුල්කරගෙන දේශනා කළා.

ඒ වාගේම තණ්හාව, දැන් රූප අරූප භවයන්වල ඉන්න අයට ඇත්තටම මේ මුල් වෙලා තියෙන්නේ තණ්හාව මිසක් අවිද්‍යාව නෙවෙයි. දැන් මනුෂ්‍ය ලෝකය තිරිසන් ලෝකය

ප්‍රේත ලෝකය වගේ ඉන්න අයට මේ අවිද්‍යාව නිසා ම යි දුක් විඳින්නේ. ඇයි, මෙයාලා කොච්චර දුක් වින්දත් ඒ දුකෙන් මිදෙන්න කැමති නෑ. ඒ දුකටම තණ්හාකරනවා. ඇයි මෝඩකම නිසා. එතැන සැපයක් නෑ. නමුත් මෝඩකම නිසා ම, දැන් මනුෂ්‍ය ලෝකය ගත්තත් එහෙම යි. මනුෂ්‍ය ලෝකයේ මොන තරම් දුක් කම්කටොලු තියෙනවා ද? නමුත් මේ කාමයන්ට ම ආසා කරන්නේ අවිද්‍යාව නිසායි. අන්න ඒ නිසා එබඳු අයට උපකාර පිණිස උන්වහන්සේ අවිද්‍යාව දේශනා කරා.

භව තණ්හාව මුල්කරගෙන බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ මේ රූපාරූප භවයන්හි, දිව්‍යලෝකයේත් යම් ප්‍රමාණයක් තියෙනවා. විශේෂයෙන් රූප ලෝකවල, අරූප ලෝකවල මේ ලෝකවල ඉන්නේ ඒවයෙ තියෙන අප්‍රමාණ සුවය නිසා ඒ තණ්හාව ම යි එතැන මුල් වෙලා තියෙන්නේ. ඒ තණ්හාව මුල්වෙලා තියෙන නිසා උන්වහන්සේ ඒ තණ්හාව මුල් කරගෙන එබඳු අයට අනුකම්පා පිණිස බුදුරජාණන් වහන්සේ ඒ විදිහට මේ ධර්මතා දෙකක් මුල්කරගෙන දේශනා කරා. ඒකට බුදුරජාණන් වහන්සේ විසින් ඒ දේශනා කරපු උපමාවන් අරගෙන මේ අටඨකතාව පෙන්වනවා. නමුත් ඒවා අපි කතා කරන්න ගියොත් අපේ මේ දේශනාව ගොඩාක් දීර්ඝ වන නිසා මම ඒවා ගන්නේ නැතුව ඒ බුදුරජාණන් වහන්සේගේ ඒ දේශනාවන් ඒ විදියට තියෙනවා කියලා ඔබට ඒ අන්තර්ගතය විතරයි පැහැදිලි කළේ.

ඒ වගේම බුදුරජාණන් වහන්සේ ඇතැම් වෙලාවල් වලට එක ධර්මයක් මුල්කරගෙන දේශනා කරනවා. ඇතැම් වෙලාවට ධර්මතා දෙකක් මුල්කරගෙන දේශනා කරනවා. මහණෙනි

අවිද්‍යා නීවරණයත්, තණ්හා සංයෝජනයත් නිසා මහණෙනි, මේ සංසාරයේ නුඹලාත් මමත් මේ සසර සැරි සැරුවා කියලා ධර්මතා දෙකක් මුල්කරගන්නවා. මහණෙනි, අවිද්‍යාවත් තණ්හාවත් තණ්හා සංයෝජනයත් නිසා මහණෙනි, නුඹලාත් මමත් මේ සංසාරයේ සසර ආවා කියලා ඇතැම් වෙලාවට මේ විදිහට දේශනා කරා. ***අවිජ්ජා නීවරණස්ස භික්ඛවෙ බාලස්ස තණ්හාය*** කියලා මේ විදිහට බුදුරජාණන් වහන්සේ දේශනා කරල තියෙනවා. ඒවා අපිට යම් ප්‍රමාණයකින් ඔබ දැනගෙන හිටියාම ඇති.

ඇතැම් වෙලාවට එක් කාරණාවක් ඇතැම් වෙලාවට කාරණා දෙකක් මේ ඔබට මතක් කරන්නේ මේ බණ භාවනා කරන්න ගියාම ඇතැම් වෙලාවට අපිට මේ ධර්මතා වැටහෙනවා. ඒ වැටහෙනකොට අර ධර්මය දන්න කෙනා මෙහෙම දේශනා කරලා තියෙනවා නේ කියලා ඒ වැටහෙන අවබෝධය ඔස්සේ ඉදිරියට යනවා. ඇතැම් අයට එතැන විචිකිච්ඡාව ඇතිවෙනවා. මෙහෙම බැලුවොත් වැරැදි ද දන්නේ නැහැ. මෙහෙම වැටැහෙනවා. ඒ වැටැහීම හරිද දන්නේ නැහැ කියලා සැකය ඇතිවෙලා සමහරවිට අර අවබෝධය එතැනින් නතර වෙනවා. අන්න ඒ නිසායි කියන්නේ අර සැකය කියන එක විචිකිච්ඡාව කියන එක මේ නීවරණයක් හැටියට යි පෙන්නලා තියෙන්නේ. ධර්මය නො දන්නා කෙනාට සැකයක් ඇතිවුණොත් එතනින් එහාට යන්න පුලුවන් කමක් නෑ.

හොඳයි අපි අර්ථ කතාවේ ඒ විදිහට මේ තියෙන තොරතුරු ටිකක් කතා කර ගත්තේ. දැන් අපි ඒ පටිච්චසමුප්පාදය පිළිබඳව තියෙන මූලික දේශනාව අපි කතා කරොත්, මේ **පටිච්චසමුප්පාද විභඞ්ගය** ගත්තහම, ඒ පටිච්චසමුප්පාද විභඞ්ගයේ දැන් මේ අංග ටික බෙදලා පෙන්නනවා.

එතකොට ඒ අංග අවිද්‍යා-සංඛාර-විඤ්ඤාණ-නාමරූප-සළායතන-ඵස්ස-වේදනා-තණ්හා-උපාදාන-භව-ජාති-ජරා-මරණ-සෝක-පරිදේව කියන අංග දොළහක් තියෙන බව ඔබ මේ පටිච්චසමුප්පාදය දන්නවා. එතකොට ඒක අනුලෝම ප්‍රතිලෝම වශයෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, අවිද්‍යාවේ ඉඳන් ජරා මරණ දක්වා. එතකොට ඒකේ මේ පටිච්චසමුප්පාද විභඞ්ගයේ පෙන්නන්නේ මේ ***අවිද්‍යා පච්චයා සංඛාරා*** කියනකොට ***තත්ථ කතමා අවිජ්ජා?*** එකල්හි අවිද්‍යාව කියන්නේ මොකක්ද? ***තත්ථ කතමා සංඛාරා?*** අවිද්‍යාව ප්‍රත්‍යයෙන් සංඛාර කියන්නේ මොනවාද? ***සංඛාර පච්චයා විඤ්ඤාණං***? ඒ සංඛාර ප්‍රත්‍යයෙන් ඉපදෙන විඤ්ඤාණ මොනවාද කියලා අපි ඒ ප්‍රායෝගික ජීවිතයෙන් තේරුම් ගන්ඩ ඕනේ. ඒක තමයි මේ පටිච්චසමුප්පාද විභඞ්ගයෙන් බුදු රජාණන් වහන්සේ මතු කරලා පෙන්නන්නේ.

එතකොට මේ අවිද්‍යාව, අවිද්‍යාව කියලා කියනවා. මොකක්ද මේ අවිජ්ජාව? එතකොට අපිට මේ සූත්‍රයේ පෙන්නන්නේ අවිද්‍යාව කියන්නේ ***දුක්ඛෙ අඤ්ඤාණං සමුදයෙ අඤ්ඤානං, දුක්ඛ නිරෝධයෙ අඤ්ඤාණං, දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදාය අඤ්ඤාණං අයං වුච්චති අවිජ්ජා.*** එහි අවිද්‍යාව කවරේද? දුක්ඛ සත්‍යය නොදැනීම, සමුදය සත්‍යය නොදැනීම, දුක්ඛ නිරෝධ සත්‍යය නොදැනීම, නිරෝධ ගාමිණී පටිපදා කියන මේ මාර්ග සත්‍යය නො දැනීම කියන එක තමයි අවිද්‍යාව කියලා කියන්නේ, බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ.

ඒ වගේම ඇතැම් **ධම්මසඞ්ගණිය** වගේ ගත්තහම, එතැන දී තව කාරණාවක්. ***පුබ්බන්තෙ කංඛති, අපරන්තෙ කංඛති,***

***පුබ්බන්ත අපරන්තෙ කංඛති. ඉධ පටිච්චසමුප්පාදෙසු ධම්මෙසු කංඛති*** කියලා තව කාරණාවක් පෙන්නලා අට කාරණාවක් පෙන්නනවා. ඔබ අහල ඇති <u>*අටතැන්හි නො දන්නාකම අවිද්‍යාවයි*</u> කියලා කියනවා. මේක හරි ලස්සනයි. ඉතින් ඒ කාරණා අපි තේරුම් ගත්තොත් මේ වචන ඔබ දන්නවා ඇති. නමුත් මේ වචනානුසාරයෙන් ඔබ මෙහි අර්ථය තේරුම් ගන්න ගියොත් මේ තමන්ගේ මෝඩකම කියන්නේ මොකක්ද කියන එක අපිටම හෙළිවෙනවා.

***පුබ්බන්තෙ කංඛති*** කියන කොට පෙර පිළිබඳව සැකය. ***අපරන්තෙ කංඛති***, මතු පිළිබඳව සැක ඇති එතකොට මේ දෙක පිළිබඳව ඇතිවන සැකය, පටිච්චසමුප්පාද ධර්මය පිළිබඳව ඇති සැකය. දැන් අපි හැමෝටම තියෙනවා. අතීතය පිළිබඳව සැකය. අතීතයේ කරපු කියපු දේවල් අපට නිරුද්ධ නැහැ. ඒ වගේම භවය ගත්තම අතීතයේ අපි හිටියා. අතීතයේ අසවල් අය වෙලා ඉන්ඩ ඇති. ඒ වගේම කවුරු වෙලා ඉන්න ඇත්ද? කියලා මේ වගේ සැක උපදිනවා. ඒ සැක නෙවෙයි. ඒ විදියට අපි හිතනවා. මේක ම අපේ අවිද්‍යාව යි. නො දන්නාකම නිසයි. නමුත් එතැන තිබුණේ අපි නො දන්නවාට අතීතය තිබුනොත් හේතුඵල ධර්මතාවයක්. අනාගතේ අපි කොහෙට යයිද කවුරු වෙයිද කවරෙක් වෙයිද මොන ආකාරයෙන් උපදී ද කියලා මේ වගේ අනාගතය පිළිබඳව අපිට භය ඇතිවෙනවා. අනාගතයේ තමන් උපදිනවා මේ මේ තැන්වල. ඒ වගේම අපි අනාගතයට තණ්හාකරලා දෙවියෙක් වෙන්න ඕන බ්‍රහ්මයෙක් වෙන්න ඕන, මනුෂ්‍යයෙක් වෙන්න ඕන කියලා මේ විදියට අනාගතය පිළිබඳව අපි වැරදි සංකල්පය ඇති කරගන්නේ අවිද්‍යාව නිසා. ඒ වගේම පටිච්චසමුප්පාද ධර්මය නො දන්නාකම නිසා, ඇසට රූපයක් ගැටෙන කොට මේ රූපය

දැක්කෙ මෙන්න මේ නිසා මේ ප්‍රත්‍යය වීමෙනුයි මේ දැක්ම වුනේ කියන  එක දන්නෙ නෑ. දන්නෙ නැති නිසා මම දැක්කා මම ඇහුවා කියලා මේ විදිය මේවා තමයි අවිද්‍යාව කියල කියන්නේ. නො දන්නාකම කියලා කියන්නේ.

එතකොට ඒක බුදුරජාණන් වහන්සේ මේ අවිද්‍යාව කියන වචනය දේශනා කළේ, වචනය පැහැදිලි කරනවා මේ අට්ඨ කතාවේම. මේ කියන්නේ නො පිරිය යුතු කාය දුශ්චරිත ආදී ධර්මයන් පුරණුයේ අවිද්‍යාව යි කියලා. ඒ කියන්නේ දැන් තමන්ට අනර්ථය ගෙන දෙන,  දුක පිණිස පවතින, දුශ්චරිතයක් - කාය දුශ්චරිත, වචී දුශ්චරිත,  මනෝ දුෂ්චරිතයන් කියන දුශ්චරිතයන් නැවත නැවත කරනවා කියන්නේ මේ අවිද්‍යාව නිසා යි. ඒ වගේම මේ ස්කන්ධයන්ගේ ස්කන්ධ අර්ථය,  ධාතූන්ගේ ධාතු අර්ථය, මේ ස්කන්ධ ධාතු ආයතන ද නො  දැනීම. දැන් යමක් අපිට පේනකොට ඇහෙනකොට ස්කන්ධ ටිකක් හටගන්නේ. නමුත් මේ ස්කන්ධ ටිකක් හට ගත්තා කියලා අපි දන්නේ නෑ. අන්න ඒ ස්කන්ධ ටික නොපෙනී,  අපිට පුද්ගලයෙකු පෙනෙන්නේ.  දැන් අපේ ඇස් ඉදිරියට හම්බවෙනකොට ඇත්තටම අපිට හම්බවෙන්නේ, අපට පෙනෙන්නේ රූපස්කන්ධය යි.  අපි තවත් සරලව කිව්වොත් මේ කෙස් ලොම් නිය දත් සම් මස් නහර ආදී කුණප කොටස් ටිකක් තමයි අපිට මේ චක්ඛු විඤ්ඤාණය හරහා පෙනීම සිද්ධවෙන්නේ.

නමුත් නො දන්නා කම කියන එක යෙදිලා අපි ඒක අරමුණු කරලා,  මේ ස්ත්‍රිය පුරුෂයා දරුවා සත්ත්වයාය පුද්ගලයාය කියලා මේ වැරදි අදහස් ඇති කරගෙන ඉන්නේ අවිද්‍යාව නිසා යි. එතකොට මේ නො දන්නාකම කියන එක අපේ

සිතේ තියනවා. මම මීට ඉස්සෙල්ලාත් ඔබට මතක් කරා මේ නො දන්නාකම කියන එක කොහොමද අපි තේරුම් ගන්නේ කියලා.

මම ඒකට උපමාවක් ඔබට කිව්වොත් කුඩා ළමයෙක්, දැන් දණගානා ළමයෙක් හිටියොත්, ලඟ පහණක් හෝ ගින්දර වගේ දෙයක් තිබුණොත්, ඒ පහන් දැල්ලට ආසාව නිසා මේ කුඩා දරුවා දණ ගාගෙන ගිහින් අල්ලනවා. අල්ලලා පිච්චෙනවා. දැන් මෙතනම ඉන්නවා තව කෙනෙක්. එයා කවදාවත් මේ පහන් දැල්ල ලස්සන තිබුනට ආලෝකය තිබුණට ඒක අල්ලන්න යන්නෙ නෑ. කුඩා දරුවා අල්ලනවා. එතකොට මේ දෙන්නටම පෙනුණේ එකම පහණ යි. එක් කෙනෙක් ඇල්ලුවා. එක්කෙනෙක් ඇල්ලුවෙ නෑ. එහෙනම් ඔබට තේරෙනවා ඇති මේ එක් කෙනෙකුගේ හිතේ යම් ධර්මතාවයක් ක්‍රියාත්මක වුණා. පේන දේ පිළිබඳව යථාර්ථය නො දන්නාකම තියන නිසා ඔහු කයින් වචනයෙන් සිතින් තමන්ට අනර්ථය පිණිසම කටයුතු කරගන්නවා. අර දන්න කෙනාගේ ඒ පහන් දැල්ල පෙනෙන කොට ඔවුන්ට ඒ සිතේ මේ දන්නා බව කියන මේ අරමුණ පිළිබඳව යථාර්ථය මම මේ උපමාව යි පෙන්නන්නේ. යථාර්ථය පිලිබඳව දන්නාකම නිසා ඔහු ඒ අනර්ථය සිද්ධ කර ගන්නේ නැහැ.

අන්න ඒ වාගේ යම්කිසි කෙනෙකුට මේ ඇහැ-කන-නාසය-දිව-සරීරය-මනස කියන මේ ආයතනවලට බාහිර අරමුණු ගැටෙනකොට මේ අරමුණුවල යථාර්ථය අපි උත්පත්තියෙන් ම දන්නෙ නෑ. මේ සංසාරය අපි හුරු කරලා තියෙන්නෙ වැරැද්ද යි. ඉතින් මෙන්න මේ නො දන්නාකම නිසා ඇස් හමුවට හම්බවෙන ඒවා කෙරෙහි අප තුළ වැරදි සංඛාරයන් ඇති කරගන්නවා. ඉතින් අන්න ඒ නිසා මේ අවිද්‍යාව කියලා

කියන මේ ස්කන්ධයන්ගේ ස්කන්ධඅර්ථය, ධාතුන්ගේ ධාතු අර්ථය ඒවාගේ ආයතනයන්ගේ ආයතන ස්වභාවයන් නො දන්නාකම තමයි අවිද්‍යාව කියලා කියන්නේ.

ඒ වාගේම මේ ධර්මයන් මේ ප්‍රත්‍යයෙන් හටගන්නවා. මේ පටිච්චසමුප්පන්න බව නො දන්නා කමයි. ඒ කියන්නේ අපිට ශබ්දයක් ඇහෙන කොට කෙනෙක් කතා කරනකොට මේ කතා කිරීම කියන එක හටගත්තේ මෙහෙමයි කියල දන්නෙ නෑ. ඒ නිසා අහවලා බැන්නා අහවලා දොස් කිව්වා අහවලා ගුණ කිව්වා, අහවල් දේ කියලා අපි මේ අතීත අනාගත වශයෙන් ගැට ගහන්නේ මෙන්න මේ අවිද්‍යාව නිසා යි. හේතුඵල දහම නො දන්නාකම නිසා යි. මේ පරමාර්ථ ධර්මයන් අපි නො දන්නා කම නිසා අපි ඒවා කෙරෙහි සත්ත්ව-පුද්ගල අදහස් ඇති කරගන්නවා.

ඒ නිසා මෙතන අවිද්‍යාව කියලා කිව්වේ අන්න ඒ වගේ තමන්ට හිත පිණිස දේවල්වල යොදවන්නේ නැහැ. ඇත්තට ම පවතින දේ වහනවා. අවිද්‍යාවෙන් කෘත්‍ය දෙකක් කරනවා. සත්‍යය වහාලනවා. වැරැදි දෙයක් පෙන්නනවා කියන කෘත්‍යය දෙකක් පෙන්නනවා. සත්‍යය මුවාකරන බව කියන එක ධර්මයක් වශයෙන් තියෙනවා. ඒ නිසා අපට ඒක පේන්නේ නෑ. මේක අපි නුවණින් අවබෝධ කරගන්න ඕන. ඇත්ත නො පෙන්නන බව කියන එක හිතේ යෙදිලා තියන එක අපි අර භාවනාවෙන් හොඳට බලන්න මේක අමුණක් අරගෙන. ඔබටම තේරේවි එහෙනම් මේ කෙනෙක් රැවටුණා පුද්ගලයෙක් රැවටුනා එහෙම නැතිනම් කෙනෙක් මේක කරා නෙවෙයි. නො පෙනෙන වූ අප්‍රකට වූ ධර්මතාවයක් සිතේ යෙදෙනවා. එහෙම ධර්මතාවයක් සත්‍ය වශයෙන් යෙදෙන නිසා තමයි මෙතන එහෙම නැති උනහම තවත් අපිට

වෙනසක් පෙනෙන්නේ. ඒ ධර්මය ඇති වුණාම නැති උනාම අපිට මේ ක්‍රියාකාරකම් වල වෙනසක් පේනවා. එහෙනම් අපිට නො පෙනුනාට පරමාර්ථ වශයෙන් යම්කිසි ධර්මතාවයකදී ඇතිවීම පැවත්ම නැතිවීම කියන දෙයක් සිද්ධ වෙනවා කියලා අන්න ඒ විදිහට මේ පටිච්චසමුප්පාදයේ මේ සියලු දේ අපි තේරුම් ගන්න ඕනේ. එහෙනම් මේ නො දන්නාකම වෙනුවට අපි දන්නාකම උපද්දවා ගන්න ඕනේ.

ඉතින් ඒ විදියට පින්වතුනි මේ අවිද්‍යාව පිළිබඳව ඔය විදිහට අපි තේරුම් ගන්න ඕන. විශේෂයෙන් ***දුක්ඛෙ අඤ්ඤාණං දුක්ඛ සමුදය නිරෝධයෙ මාර්ගයෙ අඤ්ඤාණං*** කියලා බුදුරජාණන් වහන්සේ එහි තියෙන සියල්ල හකුලලා ඉවරවෙලා දේශනා කළේ. ***දුක්ඛේ අඤ්ඤාණං*** කියලා කියන කොට මේ ප්‍රත්‍යයෙන් හටගත්තු සියලු සංඛත ධර්මයන් පිළිබඳව නො දන්නා කමයි. එහෙම නැතුව ***දුක්ඛෙ අඤාණං*** කියනකොට මේ ලෙඩවීම මහලුවීම මරණය, මේ සත්ත්ව පුද්ගල භාවය ඔලුවේ කැක්කුම, කොන්දේ කැක්කුම, කන් කැක්කුම ආදී මේවා නො දන්නා කම කියන එක නෙවේ. ලෝක සත්වයා දුක හැටියට දකින්නේ ඔය දුක් විඳින පුද්ගලයෙක් දුක් විඳින දේවල්. යම් වේදනාවක් තියෙනවා. ඒ වේදනාවට අපි පැනවීම් කරලා තියෙනවා. ඒ පැනවීම් ඔස්සේ අපි පුද්ගල භාවය තමයි දකින්නේ. ඒක දුක දැකීම නෙමෙයි. අපිට කෙනෙක් බනින කොට දුකක් ඇතිවෙනවා. එහෙම නැතිනම් අපේ මේ ජරාවට ලෙඩ වෙනකොට දුක එනවා. එතකොට මම ලෙඩ වුණා නෙවෙයි. එතැන පවතින්නේ මෙන්න මෙහෙම ස්කන්ධයාට මෙය විපරිනාමයක් කියලා අන්න ඒක අපි අවබෝධ වෙන්නේ නෑ. එහෙනම් ඇත්තටම යම් දුකක් උපදිනවා නම්, මේ දුක ඇතුලට ගිහිල්ලා, විමසලා නුවණින් බැලුවොත් අපිට

පුද්ගලයෙක් විඳින දුකක් නෙවෙයි පෙනෙන්නේ. ඔබට පෙනෙන්නේ  ස්කන්ධ ටික ඇතිවෙන නැතිවෙන බව විපරිණාම වන බව පෙනෙයි. අන්න ඒ විදියට බුදුරජාණන් වහන්සේ මේ පංච උපාදානස්කන්ධයයි දුක හැටියට පෙන්නුවේ.

එතකොට හැම තැනකම යම් ලෝකයේ දුකක් හට ගන්නවා නම් ඒ පංච උපාදානස්කන්ධයාගේ හටගැනීමයි කියලා යම් කිසි කෙනෙක් දුක හැටියට සත්ව පුද්ගල නොවුණු අනාත්ම වූ මේ නාම රූප ධර්මයන් ස්කන්ධ ධර්මයන් පරමාර්ථ ධර්මයන් නො දකීද ඔහු දුක දකින්නේ නෑ කියලා කියනවා. යම් කිසි කෙනෙක්ට  දුකක් උපදිනකොට මේ අවස්ථාවේ මෙන්න මෙහෙම අනාත්ම ධර්මතාවයකුයි හට ගත්තේ. ඒ ධර්මතාවය හටගත්ත සැනින් බිඳිලා යනවා කියලා දැක්කොත් අන්න ඔහු දුක දන්න කෙනෙක්, දුක දකින කෙනෙක්. එහෙම නැතුව අපි අද හිතන මේ දුක නො දැනී ම නෙවෙයි.

ඒ වාගේ ම සමුදය කියන එක ගත්තහම සමුදය සත්‍යය කියන එක, ***සමුදයෙ අඤාණං*** කියන එක, එතකොට බොහෝවිට ***සමුදයෙ අඤාණං*** කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ සමුදය සමුදය කියලා කිව්වේ තණ්හාවට යි. තණ්හාව මුල්කරගෙන තමයි බුදුරජාණන් වහන්සේ සමුදය සත්‍යය හැටියට පෙන්නුවේ. දුක ඇතිවෙන්න හේතුව. දුක ඇතිවෙන්න එකම හේතුව තණ්හාව නිසා නෙවෙයි. දුකේ ආරම්භය අවිද්‍යාවයි. නමුත් මේ තණ්හාව තමයි මේක උපද්දවන්නේ. ඒ නිසා ලෝකයා දුකට හේතුව දකින්නේ තණ්හාව ඇති වීම නෙවෙයි. සම්පූර්ණ අනික් පැත්ත යි. ඒවට ආශාව තණ්හාව කියන එක ලෝකයා දකින්නේ ඒක අවශ්‍ය දෙයක් හැටියටයි. මේවා ආශාවෙන් තණ්හාවෙන්

එකතු කරගන්න ඕනි. ඒ විදියට මේවා එකතු කරගත්තේ නැත්නම් පරිස්සම් කරගත්තේ නැත්තම් දුක් විඳින්න වෙනවා කියලා යමකින් දුක උපදිනවාද ඒ දුක උපදින හේතුවම ඔහු දුකේ නැතිවීම හැටියට දැක්කොත්, කෙනෙක්, ඔහු දුකෙන් මිදෙනවා ද කියලා බුදුරජාණන් වහන්සේ අහනවා. ***පඨවිං රූපං භික්ඛවේ අභිනන්දති දුක්ඛං සො අභිනන්දති.*** යමෙක් රූපය අභිනන්දනය කරනවා නම්, ඔහු දුකයි අභිනන්දනය කරන්නේ. ***දුක්ඛස්සො අභිනන්දතො අපරිමුත්තොස්මි දුක්ඛස්මාති වදාමි.*** යමෙක් ඒ දුක අභිනන්දනය කරනවා නම් සතුටුවෙනවා නම්, ඔහු දුකෙන් මිදෙයි ද? ඔහු දුකෙන් මිදෙන්නේ නැහැ. ඉතින් අන්න ඒ නිසා අපට පෙනෙන මේ යම් යම් දෙයකට තණ්හා කරනවා නම් මේ සියල්ල දුකක් ම යි. ඔහු දුකට යි තණ්හා කරන්නේ. අපි මිල මුදල්වලට, යාන වාහනවලට, ඉඩකඩම්, ගෙවල් දොරවල්,මේවාට යි අපි ආසාව, තණ්හාව ඇතිකරගන්නේ. දැන් මොකද, රෑ දාවල් දෙකේ මේ අපි දුකට හේතු ටික යි හදන්නේ. දුක යි එකතු කරන්නේ.

ඉතින් බලන්න පින්වතුනි, යම් කෙනෙකුට කිසි කලෙකත් නො තේරුනොත් ඔහු දුකෙන් මිදෙන්න කියලා දුක ම රැස්කරනවා නේ ද. ඔහුට හීනයකින්වත් දුකෙන් මිදෙන්න පුළුවන් ද? යම් වෙලාවක මේ අල්ලාගැනීමයි දුකට හේතුව. මේ ආසාවයි දුකට හේතුව කියලා යම් ප්‍රමාණයකින් දැක්කොත්, එදාට ඒක ඔහු ටික අතහරින්න අතහරින්න පුදුමාකාර සැනැසිල්ලක්. අන්න දුකෙන් නිදහස් වීමක් ඔහුට තියෙනවා.

අන්න ඒ නිසා පින්වතුනි මේ විදියට මේක අපි ඉදිරි සතියේදී සාකච්ඡා කරමු දීර්ඝ වශයෙන්. මේ වෙලාවේදී මම

කෙටියෙන් මේක පැහැදිලි කරගෙන යනවා. එතකොට සමුදය නො දැනීම නිරෝධය, දුක්ඛ නිරෝධ සත්‍යය කියන්නේ මේ ස්කන්ධයන් නිරෝධය කියන එක ලෝක සත්ත්වයා දන්නෙ නෑ. හැම වෙලාවෙම මේ ලෝක සත්ත්වයා බයයි මේ ස්කන්ධ නිරුද්ධ වෙනවාට. ඇයි ස්කන්ධ ටික මම කියලා අල්ලාගත්තහම මම නැතිවෙනවාට බයයි. ඇයි? ඒකට තණ්හා කරලායි තියෙන්නේ. එනිසා හැම වෙලාවේ ම ලෝක සත්ත්වයා හදන්නේ “මම“ පවත්වාගන්න යි. නිරෝධයට කවදාවත් කැමැතිවෙන්නේ නැහැ. ඒ නිරෝධය කියන එක අහන්නවත් කැමැති වෙන්නේ නැහැ. ඇතැම් අය බණ භාවනා කරනවා කියන කොට පැවිදිවෙන්න යනවා කියන කොට ඇයි මොකක් ද හේතුව? මොකක් ද ප්‍රශ්නය කියලා අහනවා. මේ අහන්නේ මේක මහා අනර්ථයක් හැටියට යි. අන්න ඒ විදියට ***නිරෝධයෙ අඤ්ඤාණං.*** තණ්හාව කියන එක නැතිකරොත් දුක නිරුද්ධවෙනවා කියන එක ලෝකයාට අප්‍රකට යි. ඒක වැටැහෙන්නේ නැහැ. ඒ නිසයි මේ පටිච්චසමුප්පාදය මේ තරම් ගැඹුරුයි කියලා කියන්නේ. ලෝකයා හැම වේලාවේ ම හිතන්නේ මේ ආශාව කියන එක, තණ්හාව දැඩිව අල්ලා ගැනීම කියන එක ඕනේ කියලා යි. ඉතින් මේක නැතිකරොත්ම ඒක එයාට වැටහෙනවා මිසක්, අල්ලාගෙන කවදාවත් ඒක අවබෝධ කරගන්න බෑ. ඒ නිසා අත්හරින්න, **අත්හරින්න සැප ලැබෙනවා** කියන එක ඒක දහම් න්‍යායක්. ඒක මේ බුදුරජාණන් වහන්සේ නමක් දේශනා කරපු, මතුකරපු එකක් මිසක, ඒක මේ බුදුරජාණන් වහන්සේ විසින් නිර්මාණය කරලා දේශනාකරපු එකක් නෙවෙයි. බුදුරජාණන් වහන්සේ ඇතිකලත්, නැතිකලත්, අබුද්ධොත්පාද කාලවලත් යම් කිසි කෙනෙක් තමන්ට කැමති කැමති දේ අත්හරියි ද, දෙයි ද, ත්‍යාගශීලී වෙයි ද, ඒ

තමයි සැප ලැබීමේ හේතුව. ඒ තමයි දුකින් මිදීමේ හේතුව. ඒක ධර්මතාවයක්. ධම්මනියාමතාවයක්. ඒක බුදු කෙනෙක් ඇති කල්හි ත් නැතිකල්හිත් ලෝකයේ පවතිනවා. එතකොට ඒ විදිය යි නිරෝධ සත්‍යය.

මාර්ග සත්‍යය හැටියට පෙන්නන මේ දුක නැති කරන වැඩපිළිවෙළ. වැඩපිළිවෙලේ අඥානකමක් තියෙනවා. හැම වෙලාවෙම දුක නැති කරන්න කියලා ලෝකයා හදන්නේ පුළුවන් තරම් ගෙවල් දොරවල්, ඉඩකඩම් යාන වාහන රැකීරක්ෂා මේ දේවල් කරමින් ඒ දේවල් එකතු කරමින් රැස් කරමින්, නැත්නම් දුක් විඳින්න වෙනවා. දරුවන් නැතුවුණොත් දුක් විඳින්න වෙනවා. ඉඩකඩම් නැති උනොත් දුක් විදින්න වෙනවා. කසාදයක් බැඳ ගත්තේ නැත්තන් දුක් විදින්න වෙනවා. සල්ලි මිලමුදල් නැති උනොත් දුක් විදින්න වෙනවා කියලා, මේ විදියට ඒවා ගවේෂණය කරනවා. <u>දුකින් මිදීමේ හේතුව හැටියට දුක ඇති වෙන ක්‍රමය ම දැකලා දැන් දුක ඇති වෙන විදියට ම කටයුතු කරනවා.</u> ඉතින් කවදාවත් ලෝක සත්ත්වයා දුකෙන් මිදෙන්නේ නැහැ.

ඒ නිසා දුක නැති කරන වැඩපිළිවෙළ හාත්පසින්ම වෙනස් එකක්. ඒක මේ අවිද්‍යාව තණ්හාව දුරු වෙන ආකාරයේ දැක්මක්. සත්‍ය දැක්මක්. ඒ සත්‍ය නො දන්නාකම නිසයි මේ අඥානකම ලෝකයා කරන්නේ. ඒ නිසා යම් දවසක අපි මේ අල්ලාගන බදාගන උපාදාන කරගෙන ඉන්න දේවල් තුළ යථාර්ථය අවබෝධ කරගත්තොත් දැකගත්තොත් ඇත්තටම ඔහු ටික ටික දුකෙන් ගෙවෙනවා. ඉතින් ඒ නිසා පින්වතුනි නො දන්නාකම නිසා නැති දේවල් අපි මවාගෙන, සත්ත්වයෝ පුද්ගලයෝ නැති තැනක සත්ත්ව පුද්ගල අදහස් ඇති කරගෙන දුක් විඳින ලෝකයක ලෝකෙට බුදුරජාණන්

වහන්සේ නමක් පහළ වෙලා ඒ සත්ත්ව පුද්ගල භාවයේ තියෙන යථාර්ථය මතුකරලා පෙන්නුවා. අන්න ඒක දකින්න උත්සාහවත් වෙන්න වෙන්න තමයි ඔහුට ඒ දුක නැතිවෙලා මාර්ගය උපදින්නේ. ඉතින් ඒ නිසා තවත් මේ තියෙනවා පුබ්බන්ත අපරන්තය ආදී  මේ නොදැනීම කියන දේවලුත් විස්තර කරගත යුතුයි.

ඉතින් අන්න ඒ විදිහට පින්වතුනි,  මේ එක වචනයක් ගත්තොත්, මේ අවිද්‍යාව කියන එක ගත්තත්,  දේශනා ගණනාවක් කරන්න පුළුවන් විදියේ මේ සොඳුරු බවක් ඒ ධර්මතා තුළ තියෙනවා. ඒ අවිද්‍යාව මේ කොච්චර කතා කළත්,  අපි මේවා කොයිතරම් දැන ගත්තත් ඒක තමා තුළින් මේ අවිද්‍යාව කියන්නේ මොකක්ද කියලාම අපි අවබෝධ කර ගන්න ඕන. ඒ සඳහායි අපි මේ උත්සාහ කරන්නේ. මේ මෝඩකම කියන එක නො දන්නාකම කියන්නේ මොකක්ද? ඒක පින්වතුනි,  යම් දවසක මේ විද්‍යාව කියන එක ඇත්ත කියන එක අවබෝධවෙච්චි දවසට තමයි ඇත්තට ම එයාට මෝඩකම කියන එක එයාට මනා කොට වැටැහෙන්නේ.

දැන් සත්ත්වයින් පුද්ගලයින් වශයෙන් අපි මුලාවෙලා ඉන්නකොට බුදුරජාණන්වහන්සේ, මහණෙනි දුකට හේතුව ආශාව යි, තණ්හාව යි, මෝඩකම යි. ඕක නැතිකර ගනිල්ලා. ඕක හිතෙන් අයින්කර ගනිල්ලා, ඔහොම හිතන්න එපා කියලා දේශනා කරේ නැහැ. උන්වහන්සේ ඒ අදහස් නැතිකරන්න වෙන ම මාර්ගයක් පැනෙව්වා. ඒ ඇත්ත, සත්‍යතාවය මතුකරළා තියලා ඔබට දකින අහන දේ තියෙන යථාර්ථය ඔබ දකින්න. මෙන්න මේ ටික යි තියෙන්නේ කියලා පෙන්නලා දුන්නා.

අන්න ඒ ටික යම්කිසි කෙනෙක් අවබෝධ කරගන්න කොට එදාට තමයි ඔහුට පෙනෙන්නේ මෙච්චර කාලයක් ම මම අවිද්‍යාව තුළ නේ ද හිටියේ. මෝඩකම තුළ නේ ද හිටියේ. මේ විඤ්ඤාණය නමැති මායාකාරයා විසින් මේ මෝඩකමට එක එක දේවල් මවලා මවලා අපව මුලාකරලා, නැති දේවල් පෙන්නලා, අපව දුකට ඇදලා තියෙනවා නේ ද කියලා තමන්ට ම ලජ්ජා හිතෙනවා මේ තාක් අපි මේ මෝඩකමෙන් කටයුතු කරපු මේ මෝඩකම කියන එක තේරුනාම. ඒ නිසා කියනවා නේ, යම් කිසි කෙනෙක් මෝඩකම මෝඩකම හැටියට දැනගත්තොත් ඔහු ප්‍රඥාවන්තයෙක්. යමෙක් මෝඩකම තමන්ගේ නුවණ හැටියට දැනගෙන ඉන්නවා නම්, ඔහු ඒ තාක් කල් ඔහු අඥානයෙක්.

ඒ නිසා ලෝකයේ තියෙන සියලු ම දේවල්, අපි සිතන මේ අපි තාක්ෂණය විද්‍යාව අතින් දියුණුය කියලා කියන මේ ඔක්කෝම පින්වතුනි මේ මෝඩකම ඇතුළේ යි තියෙන්නේ. ඒ නිසා ඒ මෝඩකම නො දන්නා තාක් කල් ඒ අය නුවණක්කාරයෝ ප්‍රඥාවන්තයෝ කියලා හිතාඉන්නවා. නමුත් ඒ වාගේ යථාර්ථය දැක්කහම තමන් කොයි තරම් මෝඩයි ද කියලා එදාට යි තේරෙන්නේ.

ඒ නිසා අදට මගේ මේ දේශනය විස්තරය අවසන් කරනවා. මේකේ තවත් විස්තර කටයුතු දේවල් තියෙනවා. අපි ඉදිරියට එකින් එකින් අංගය පිළිබඳව කතාකරගෙන යමු. ඉතින් අද මට මේ අංග එකයි කතාකරන්න පුළුවන්වුනේ. ඉදිරියේ දී අපි බලමු කිහිපයක් කතාකරන්න. ඉතින් ඒ නිසා මේ මුලින් අපි තේරුම්ගත යුතු, අවබෝධ කරගත යුතු කොටස් තියෙන නිසා තමයි මම ටිකක් මේ අමතර කාරණා ටිකක් මේ වැඩිපුර මතු කරේ. ඉතින් ඒ නිසා මේ දේශනාව තුළ ඔබට

ඇතිවෙලා තියෙන මොනවා හරි ප්‍රශ්න ගැටලු හෝ ඔබ මේ දේශනාව පසුගිය දිනවල ගවේශනය කළා නම්, බැලුවා නම් ඒ ඔස්සේ හරි කමක් නැහැ, ඔබට ඇතිවෙච්චි ප්‍රශ්න ගැටළු තියෙනවා නම් ඒ සඳහා ඉඩ අවකාශ සලසමින් මගේ දේශනාව අවසාන කරනවා. හැම දෙනාට ම තෙරුවන් කරණ යි.

---------- ---------- ---------- ----------

**ප්‍රශ්නය** :- ස්වාමීන් වහන්ස, අපි මේ හේතු ප්‍රත්‍යය හේතුව සහ ප්‍රත්‍යය කියන වචන දෙක අතර වෙනසක් තියෙනවා ද ස්වාමීන් වහන්ස?

**පිළිතුර** :- එකටමත් කියනවා හේතු-ප්‍රත්‍ය කියලා. නමුත් වෙන් වෙන් කරළාත් හේතු දක්වන්න පුළුවන් ක්‍රමයක් තියෙනවා. බුදුරජාණන් වහන්සේ එහෙම දේශනා කරපු අවස්ථා තියෙනවා. ප්‍රත්‍ය හැටියට බුදුරජාණන් වහන්සේ ඇතැම් වේලාවල පෙන්නනවා, එහි තියෙන උපකාරත්වය. හේතු හැටියට පෙන්නලා තියෙනවා එතැන තියෙන ප්‍රධාන ධර්මතාවය. දැන් මේ ශාසනයේ හේතු කියලා කතාකරන එකක් තියෙනවා. ඒ හේතු හැටියට පෙන්නන්නේ අප තුළ උපදින චිත්ත චෛතසික ධර්මයන් උපද්දවන බලවත් වෙන ධර්මතාවය යි. දැන් කර්මය ගත්තහම ඒකටත් හේතු හැටියට පෙන්නනවා. ලෝභ-ද්වේශ-මෝහ, අලෝභ-අද්වේශ-අමෝහ කියලා මේවා තමයි මේ සාසනයේ හේතු හැටියට කතා කරන්නේ. එතකොට ඒ ලෝභය කියන එක නො තිබුණා නම්, අරමුණක උපදින්නේ නැහැ. ද්වේශය කියන එක නො තිබුණා නම් ඇතැම් දේවල් උපදින්නේ නැහැ. එතකොට ඒ යම් අරමුණක් ඉපදුනා නම් ඒක නැවත නැවත උපදින්නත්, ඒක බලවත් වෙන්නත්, ලෝභය-ද්වේශය-මෝහය කියන

ධර්මතා තුන, හේතු ප්‍රත්‍යයෙන්, බලවත්භාවයෙන් උපකාර වෙනවා. හරියට ගසක මුදුන් මුලක් වගේ. ගසකට මුදුන් මුල ප්‍රධානභාවයෙන් උපකාර කරයි. හැබැයි, තවත් අතුරු මුල් තියෙනවා. මේවාත් උපකාර නො කරනවා නෙවෙයි. අන්න ඒ විදියට බුදුරජාණන් වහන්සේ ඇතැම් වේලාවල්වලට හේතු, ප්‍රත්‍ය කියලා දෙක වෙන වෙනම මතුකරළා පෙන්නලා තියෙනවා. ඇතැම් වෙලාවට බුදුරජාණන් වහන්සේ මේ හේතු, ප්‍රත්‍ය කියන දෙක ම එකට කතා කරලා තියෙන අවස්ථාත් තියෙනවා. දෙක ම එකතු කරළා. හේතු ප්‍රත්‍ය කියන - එතකොට කියලා තියෙන්නේ අර අර්ථයයි. අර මම මුලින් කිව්වේ යම් ධර්මයක්ගේ ඉපැත්මට, පැවැත්මට යමක් හේතු වෙනවා ද, ප්‍රත්‍ය වෙනවා ද, අන්න ඒක තමයි මෙතැන මේ හේතු-ප්‍රත්‍යය කියලා කියන්නේ කියලා මේ පොදුවේ කරපු දේශනාත් තියෙනවා. නමුත් අපි කාරණාවල් වශයෙන් දැනගත්තොත් අපි වෙන් වෙන් කරළා දැනගත්තොත්,

- බොහෝවිට මේ ශාසනයේ හේතු හැටියට දේශනා කරන්නේ යමක් උපදින්න ප්‍රධාන වෙන දේ යි.

- ප්‍රත්‍ය හැටියට පෙන්නන්නේ ඒකට අමතරව උපකාර කරන දේවල්.

අර අපි මුලින් මතක් කළේ ගසක් හටගන්නා බීජය ප්‍රධාන වෙනවා. ඊට අමතරව පොළොව-වාතය-හිරු එළිය-ජලය යන මේවා උපකාරක ප්‍රත්‍ය යි. හැබැයි පොළොව-වාතය-ජලය කොච්චර තිබුණත් බීජය නො තිබුණා නම් හටගන්නේ නැහැ. හැබැයි බීජය තිබුණත් අර ධර්මයෝ නො තිබුණා නම් ඒ ගහේ පැවැත්මක් නැහැ. ඒ නිසා ඇතැම් දේවල් හටගන්න මුල්වෙන දේවල්. ඇතැම් දේවල් හටගත්ත දේ පවත්වන්න

උපකාරවෙන දේවල්. එතකොට තවත් ඒ විදියට කියන්න පුළුවන්. හටගන්න උපකාරවෙන දේට හේතුව කියන්නත් පුළුවන්. හටගත්ත දේ පැවැත්මට උපකාර කරන දේ ප්‍රත්‍ය කියලා කියන්නත් පුළුවන්. ඉතින් ඒ වාගේ මේ ශාසනයේ හේතු ප්‍රත්‍ය කියලා කියන එක බුදුරජාණන් වහන්සේගේ දේශනාවන් අනන්ත නය න්‍යායයන්ගෙන් පරිපූර්ණ ඒවා යි. ඉතින් ඒ නිසා සාමානය විදියට අපට ප්‍රධාන අප්‍රධාන වශයෙන් මේ හේතු ප්‍රත්‍යය කියන කාරනා දෙක වටහාගත්තහම ප්‍රමාණවත්.

---------

**ප්‍රශ්නය** :- (අපැහැදිලි යි) හාමුදුරුවනේ අපට වේදනාව ඵස්ස පච්චයා වෙදනා වෙදනාව නිරෝධවෙන කොට එතැන තෘෂ්ණාව නිරෝධයි. එහෙම පල්ලෙහාට යන කොට ඔක්කෝම ටික නිරෝධවෙනවා නේ ද අපේ හාමුදුරුවනේ?

**පිළිතුර**:- ඔව්.

**ප්‍රශ්නය**:- එතකොට ශඩායතන නාමරූප විඤ්ඤාණ - අවිද්‍යාව එතැන්ට යනකම්ම නිරෝධයි. නේ ද අපේ හාමුදුරුවනේ. ඒ වා ඒ මොහොතේ දකින නිරෝධය දකින කොටත් ...

**පිළිතුර:-** ඔව් මෑණියෝ ඒ කියන්නේ යම්කිසි කෙනෙක් ඒ වේදනාව......

**ප්‍රශ්නය**:- එතකොට පඤ්චඋපාදානස්කන්ධයත් එතැනම නිරෝධයි නේ ද අපේ හාමුදුරුවනේ. ඵස්ස පච්චයා වෙදනා කියනකොට. ඒ විදියට නේ ද අපේ හාමුදුරුවනේ පටිච්චසමුප්පන්නව අපි දකින්න ඕනේ?

**පිළිතුර:-**ඔව් ඔව් ඔව් හරි හරි. ඒක තමන්ට වැටැහෙන ආකාරයකට, දැන් කෙනෙකුට වේදනාව දැනෙන්න පුළුවන්. කෙනෙකුට ස්පර්ශය දැනෙන්න පුළුවන්. කෙනෙකුට විඤ්ඤාණය දැනෙන්න පුළුවන්. විශේෂයෙන් වේදනාව ප්‍රතට යි. කොයි ධර්මය හටගත්තත් හටගත්ත දේ තුළ අපට ඇතිබවට ඉන්නවා-තියෙනවා කියලා කෙලෙසයක් ගොඩනැගෙන්න පුළුවන්. මෙන්න මේ කෙලෙසය ගොඩනැගෙන විදියට අපි යෝනිසෝමනසිකාරය පවත්වන්න. ඒ පවත්වන ක්‍රමය තමයි වේදනාව හටගත්තා නම් මේ වේදනාව තියෙන එකක් නෙවෙයි. මට ඇතිවෙච්චි එකක් නෙවෙයි. මේ වේදනාව ඇති වුණේ මෙහෙමයි කියලා අපට වේදනාවේ ඉඳන් අවිද්‍යාව දක්වා යන්න පුළුවන්. ඒ වාගේම මේ වේදනාවට තණ්හා කරොත් අනාගතයටත් මෙන්න මෙහෙම යනවා කියලා අනාගතය පැත්තටත් බලන්න පුළුවන්. ඒ වාගේ ම වේදනාව නිරුද්ධවෙනවා මෙහෙම බැලුවොත් වේදනාව නිසා කර්ම සකස්වෙනවා මෙහෙම අපි හිතුවොත් කියලා, අන්න ඒ නිසා අර කියපු විදියට මේ පටිච්චසමුප්පාදය අපට වේදනාවේ ඉඳන් මැද අපි ගත්තහම මැද ඉඳන් මුලට යන්නත් පුළුවන්. මැද ඉඳන් අගට යන්නත් පුළුවන්. ගිහිල්ලා අවශ්‍ය වෙන්නේ අර වේදනාව තුළ බැසගත්ත, මේ කෙනෙක් කරනවා කියන සත්ත්ව-පුද්ගලභාවය දුරුකරගැනීමට හා ඒ වේදනාව පිළිබඳව අපට ගොඩනැගෙන මේ ඇත යන සංකල්පය, නිත්‍ය යි ආත්ම යි සැප යි කියන මෙන්න මේ විපල්ලාසය දුරුවෙන විදියට පටිච්චසමුප්පාදය දිහා බැලිය යුතු යි. ඒක තමයි මෙතැන වෙන්න ඕන.

**ප්‍රශ්නය:-**එතකොට අපේ හාමුදුරුවනේ දැන් පංචඋපාදානස්කන්ධය ස්කන්ධ නිරෝධය බලන කොට

ඇසට රූපයක් දකින කොට ම සංඥාව නිරෝධනම් අපේ හාමුදුරුවනේ එතැන ශඩායතන නිරෝධයි. නාමරූප ඔක්කොම නිරෝධයි ඒ විදියට නේ ඒ විදියට බලාගන්න පුළුවන් නේ.

**පිළිතුරු:-**පුළුවන්.

---------

**ප්‍රශ්නය:-** අවසරයි ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ අපට මතුකරා මේ අවිද්‍යාවත් භවතණ්හාවත් තමයි මේ සසර ගමන යන්න මූලිකවශයෙන් ම හේතුපාදක වෙන්නේ කියලා. ස්වාමීන් වහන්ස මේ භව තණ්හාවත් භව රාගයත් කියන දෙක අතරේ තියෙන සම්බන්ධතාවය අපට පැහැදිළිකරලා දෙන්න ස්වාමීන් වහන්ස.

**පිළිතුරු:-** භවතණ්හාව කියන එකට පොදුවචනයක් ගත්තොත් ඒක අපට කියන්න පුළුවන් කාම-රූප-අරූප කියන භවයන් කෙරෙහි ඇති තණ්හාව භව තණ්හාව යි කියලා. අපට ඒ භවතණ්හාව කියන ඒ වචනයට පොදු අර්ථයක් දුන්නොත්. නමුත් බුදුරජාණන් වහන්සේ මේ තණ්හා බෙදන න්‍යායක් තියෙනවා. කාමතණ්හා-භවතණ්හා-විභවතණ්හා කියලා. රූපතණ්හා-අරූපතණ්හා-කාමතණ්හා කියලා. මෙහෙම බෙදන න්‍යායයන් තුළ අපි ඒ තැන්වල අපි ඒ අර්ථ බෙදලා ගන්න ඕන. එතකොට මෙතැන විශේෂයෙන් භව තණ්හාව හැටියට කාමතණ්හාව භවතණ්හාව කියලා දෙකක් පෙන්නලා තියෙන නිසා එතැන භවතණ්හාව හැටියට පෙන්නන්නේ රූපාරූපභවයන් කෙරෙහි එහි තියෙන ආශ්වාදයෙහි ඇලිලා ඒවා කෙරෙහි ඇතිකරගෙන තියෙන ආශාවටයි, තණ්හාවට යි භවතණ්හාව කියලා කියන්නේ. තවත් විදියකින් කිව්වොත්

රූපඅරූපභවයන් කෙරෙහි තියෙන ආශාව, කැමැත්ත, ඇලීම උපාදානය භවතණ්හාව යි. ඒ වාගේ ම කාමධර්මයන් පිළිබඳව රූප-ශබ්ද-ගන්ධ-රස-ස්පර්ශ ආදී මේ කාමයන් පිළිබඳව ඇතිවන ආශාව කාමතණ්හාව හැටියට පෙන්නනවා. එතකොට ඒකේ අපේ මහත්මයා, වෙනසක් මම දකින්නේ නැහැ මේ තණ්හාව යි රාගයයි, රූපරාග, අරූපරාග කියලා කිව්වත්, රූපතණ්හා, අරූපතණ්හා කියලා කිව්වත් බුදුරජාණන් වහන්සේ පෙන්නලා තියෙන්නේ එක ම ධර්මතාවයක්. ඉතින් ඒ නිසා මේ තණ්හාව කියන එක විවිධ වචනවලින් නිර්වචනය කරලා තියෙනවා. එතකොට තණ්හාව කියලා කියන්නේ යමකට තියෙන ඇලීම, ආශාව. මේ රාගය කියලා කියන කොට ඒකත් ඇලීම ම තමයි. ඒ යම්කිසි දේවල් කෙරේ තියෙන බැඳීම යි. රාගය, තණ්හාව, ලෝභය, ආශාව, රාගය, නන්දිය කියලා මේ නොයෙක් වචන තුළින් බුදුරජාණන් වහන්සේ මේ එක ම අර්ථය දේශනා කරලා තියෙනවා. ඇතැම් තැන්වල ඒක පොඩි පොඩි වෙනස්කම් තියෙනවා. උදාහරණයක් හැටියට අපි කියමුකෝ කාමච්ඡන්ද නීවරණය යි කියලා කිව්වොත් එතැන තියෙන්නේත් තණ්හාව තමයි. කාමඋපාදානය යි කියලා කිව්වොත් එතැන තියෙන්නේ ත් තණ්හාව යි. ලෝභය නමැති ධර්මය තමයි මේ දෙකේ ම ක්‍රියාත්මක වෙන්නේ. ධර්මතා වශයෙන් ගත්තොත් රාගය තණ්හාව ඒ ලෝභය නමැති ධර්මයේ තියෙන්නේ.

එතකොට ඒ ලෝභය නමැති ධර්මය ඇතැම් වෙලාවට කාමච්ඡන්ද නීවරණය යි කියලා පෙන්නුවේ ඒ මේ ලෝභය කියන ධර්මතාවය ඇති තතු වහලා දාන බවකුත් කරනවා. නිවන ආවරණයකරලා දාන බවකුත් කරන නිසා ඒකට, ඒ ලෝභයට හැඳින්වුවා කාමච්ඡන්ද නීවරණය කියලා. ඇතැම් වෙලාවලට ඒ ලෝභය නිසා අරමුණු දැඩිව අල්ලාගන්නවා.

දැඩිව ඒවා ග්‍රහණය කරගන්නවා. ඒ ලෝභයෙන් ම කරන තවත් වැඩක්. ඒ වැඩේ සළකලා බුදුරජාණන් වහන්සේ ඒකට කිව්වා කාමඋපාදානය කියලා. අන්න ඒ වාගේ මේ තණ්හාව, උපාදානය, රාගය, නන්දිය, ඒ සතුටුවෙනබව කියන එකත් තණ්හාව තුළ තියෙනවා. සතුටක් තියෙන නිසා තමයි ලෝකයා ඒවා අතහරින්නේ නැතුව තියාගන්නේ. ඉතින් අන්න ඒ වගේ ධර්මතා වශයෙන් එකක්, නමුත් පොඩි පොඩි වෙනස්කම් නිසා බුදුරජාණන් වහන්සේ විවිධ ව්‍යඤ්ජනයන්ගෙන්, වචනවලින් ඒ ධර්මතා පෙන්නාපු බවක් තමයි වැටැහෙන්නේ.

----------

**ප්‍රශ්නයः-** (අපැහැදිලි යි) අවසරයි ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ දේශනාවේ දී පැහැදිළි කරා පටිච්චසමුප්පාදය සතර ආකාරයකට අවිජ්ජා පච්චයා ඉඳලා වෙදනා, වෙදනා පච්චයා එතැන ඉඳලා අවිද්‍යා. වේදනා පච්චයා ඉඳලා භව. භව ඉඳලා වේදනා. ඒ විදියට හතරක් විදියට බලනකොට දැන් භාවනාවක දී ඒ පියවර හතර ම බලන්න ඕන ද? දැන් අර අංග දොළහ ඇතුළත්වෙන්නේ නැහැ නේ ද භාගයක් ගත්තහම. ඒක බලන්න ස්වාමීන් වහන්ස, සම්බන්ධකරගන්න කියලා පොඩ්ඩක් පැහැදිළි කරලා දෙන්න.

**පිළිතුරः-**මේකේ දැන් අපි දේශනාවන් බලනකොට කෙනෙකුට වැටැහෙන ආකාරයෙන් බැලුවාට ප්‍රශ්නයක් නැහැ. නමුත් අපට ඒක මනසිකාරය කරන කොට මේක අනිවාර්යයෙන් සම්බන්ධ වෙනවා. බුදුරජාණන් වහන්සේ ඒ විදියට පටන් අරගෙන මුල දක්වා ගිහිල්ලා, මුල ඉඳන් ජරා-මරණ දක්වා ආපසු විස්තර කරගෙන එනවා. නමුත් උන්වහන්සේ පටන් ගැනීම මුලින්. මුල ඉඳන් අග දක්වා යි

යන්නේ. හැබැයි ගිහිල්ලා දේශනාව සම්පූර්ණ කරන්න මේ විදියට ම උදාහරණයක් වශයෙන් කිව්වොත් මහණෙනි, මේ සතර ආහාරයක් තියෙනවා. මේ ආහාරය කුමක් නිදානකොට, කුමක් සමුදයකොට ඇත්තේ ද කියලා ඔන්න ආහාරය කියන මාතෘකාව අරන් මහණෙනි මේ ආහාරය ට හේතුව තණ්හාව යි කියලා ඔන්න තණ්හාව මතුකරනවා. මහණෙනි තණ්හාව කුමක් නිදානකොට ඇත්ද? ඒ කුමක් සමුදය කොට ඇත්ද? තණ්හාව වේදනාව යි. වේදනාව? ස්පර්ශය යි. ස්පර්ශයට හේතුව මොකක් ද? ආයතන යි. ආයතනවලට නාමරූප යි. නාම රූපවලට හේතුව මොකක් ද? විඥ්ඥාණය යි. විඥ්ඥාණයට හේතුව මොකක් ද? සංඛාරය යි. මහණෙනි සංඛාරය කුමක් නිදාන කොට කුමක් සමුදය කොටද? මහණෙනි සංඛාරය අවිද්‍යාව නිදානකොට ඇත්තේ ය. මහණෙනි, මෙසේ අවිද්‍යා පච්චයෙන් සංඛාරය වේ. සංඛාරය පච්චයෙන් විඥ්ඥාණය වේ. විඥ්ඥාණ පච්චයෙන් නාමරූප වේ කියලා ජරාමරණ දක්වා අවසන් කරනවා. අන්න ඒ විදියට බුදුරජාණන් වහන්සේ මේ දේශනාව සම්පූර්ණකරනකොට දේශනා කරනවා. ඒ නිසා අපට ඒ යෝනිසෝමනසිකාරය කරන කොට ඒ විදියට කොතැනින් ගත්තත්, ඔය විදියට කෙනෙක් අගදක්වා ගිහිල්ලා, ජාතියට හේතුව භවය යි. භවයට හේතුව උපාදානය යි. උපාදානයට හේතුව තණ්හාව යි කියලා අවිද්‍යාව දක්වා මේ පෙළ සම්පූර්ණ කරනවා.

ඉතින් ඒ විදියට අපට අතන සතර ආකාරය පෙන්නන්නේ බුදුරජාණන් වහන්සේ දේශනාව පටන්ගත්ත ආකාරය, න්‍යාය තමයි. ඉතින් එහෙම අපි කියමුකො කෙනෙක් අවිද්‍යාව කියන එක හරියට තේරුම් අරගෙන දැන් ඕකෙ ඇතැම් සූත්‍ර වල පෙන්නනවා යමෙක් අවිද්‍යාව නොදනීද, අවිද්‍යාව සමුදය

නොදනීද, අවිද්‍යා නිරෝධය නොදනීද, අවිද්‍යා නිරෝධ ගාමිණී පටිපදාව නොදනීද, මොහු මේ මේ සාසනයේ ශාසනය උණුසුම වත් ලබපු කෙනෙක් නෙමෙයි කියලා. ඉතින් එතකොට මේ අවිද්‍යාව පිළිබඳව විතරක් එතන මතු කරල පෙන්නන්නේ. ධර්මතාවයක් තමයි යම් කිසි කෙනෙක් අවිද්‍යාව කියන එක තේරුම්ගන්න ගියොත් හරියට දැන් අවිද්‍යාව නො දනීද, අවිද්‍යා සමුදය නොදනීද, අවිද්‍යාවට හේතුව බලන්න යනකොට අන්න එයාට ආපහු අර ධර්මතා සියල්ල ම මතු වෙලා එනවා. ඉතින් ඒ නිසාම එක තැනකින් පෙන්නුවට මේවා චක්‍රයක් ලෙස සම්බන්ධ වෙලා තියෙන නිසා අවබෝධ කරගන්න යනකොට මේ ධර්මතා සියල්ල පිළිබඳව අවබෝධය අපිට එනවා. ඉතින් ඒ නිසා කෙනෙකුට ඒ වගේම තවත් අපිට කියන්න පුළුවන්, කෙනෙක් අවිද්‍යාව දිහාම බලලා අවිද්‍යාව ගැනම තේරුම් අරගෙන අවිද්‍යාව හටගන්නෙ මෙහෙමයි කියලා අවිද්‍යාව නැති වෙන්නේ මෙහෙමයි කියලා යම් සීමිතව ඒක පිළිබඳව සම්මශීනය කර කර බැලුවොත් කල්පනා කළොත් තේරුම් ගත්තොත් ප්‍රත්‍යක්ෂ කරගත්තොත් ඔහුට අවිද්‍යාව නිරුද්ධ වුණොත් සංඛාරය නොබැලුවත් නිරුද්ධ වෙනවා. සංඛාරය නිරෝධ වුනොත් විඤ්ඤාණය නිරුද්ධ වෙනවා කියන ධර්මතාවයත් සිද්ධ වෙනවා. හැබැයි බැලුවේ අවිද්‍යාවයි. නමුත් ඒවා අනිත් ඒවා පිළිබඳව නුවණ ඒ අනුසාරයෙන් නැතුවා නෙවෙයි. ඉතින් ප්‍රකට වුණේ අවිද්‍යාව නම්, අවිද්‍යාව නිරෝධ කරගත්තොත් ඔහුට සංඛාර නිරෝධ කරන්න කියලා අමුතුවෙන් උත්සාහයක් අවශ්‍ය නැහැ. ඒක අනිවාර්යෙන් අවිද්‍යාව නිරුද්ධ වුණොත් නිරුද්ධ වෙනවා මයි කියන ධර්මතාවය බුදුරජාණන් වහන්සේ ***ඉමස්මිං අසති ඉදං නහොති.*** මෙය නැති උනොත් මෙය වෙන්නේ නෑ ***ඉමස්ස***

***නිරොධා ඉදං නිරුජ්ජති*** මෙය නිරුද්ධ වුණොත් මේ දේ නිරුද්ධ වෙනවා ම යි කියන ධර්මතාවය තියෙනවා. ඒ නිසා අන්න ඒ වගේ අපි ඒ දේශනාවල් ඉතින් මේ බුදුරජාණන් වහන්සේගේ දහම් නයට අනුව ගලපාගන්න. තෙරුවන් සරණයි

----------

**ප්‍රශ්නයඃ-** සම්මාදිට්ඨි සූත්‍රයෙහි අවිද්‍යාව ආශ්‍රව නිසා කියලා තියෙනවා. ඒ වගේම අවිද්‍යා සූත්‍රයේ පංචනීවරණ වගේ මට මතක. වැරදි නම් සමාවෙන්න. එහෙම ඒක සම්බන්ධයක් තියෙනවාද ස්වාමීන්වහන්ස.

**පිළිතුරඃ-** ඔව් ඔව් දැන් බුදුරජාණන් වහන්සේ ඔය ඒකෙ පෙන්නන නීවරණ නිසා, අවිද්‍යාව නිසා නීවරණ. ඕකේ පෙන්නන්නේ මහණෙනි මේ තණ්හාව හට ගන්නේ ඉබේ නෙවෙයි. ප්‍රත්‍යයෙන් හට ගන්නේ. තණ්හාවට හේතුව මොකක්ද? නීවරණ හේතු යි කියලා පෙන්නනවා. ඉතින් ඇතැම් වෙලාවට බුදුරජාණන් වහන්සේ අවිද්‍යාවට හේතුව නීවරණ යි කිව්වහම නීවරණ තුළත් අවිද්‍යා නීවරණ කියලා බුදුරජාණන් වහන්සේ වෙනම නීවරණයක් පෙන්නලා තියෙනවා. නීවරණ අපට පහක් පෙන්නලා තියෙනවා. නමුත් අවිද්‍යා නීවරණය කියලා තවත් නීවරනයක් පෙන්නලා තියෙනවා. එතකොට එතැන මේ අවිද්‍යාව කියලා කියන්නේ නොදන්නාකමයි. නොදන්නාකම කියන එක ඇති වුණේ මේ ආශ්‍රවයන් වලින් තව තවත් මෝඩකමකින් වැහිච්චි නිසායි. නො දන්නාකම නිසාම නොදන්නාකම ඇති වෙන්න පුළුවන්කම තියෙනවා. ඉතින් ඒ වගේම ඇතැම් වෙලාවට අවිද්‍යාවට හේතු ආශ්‍රව කියලා පෙන්නනවා. එතකොට ආශ්‍රව කියන තැනත් නොදන්නාකම මයි

තියෙන්නේ. පුරුද්ද නිසා. දැන් ඇතැම් දේවල් අපි, ඉස්සරෝම දෙයක් දකිනකොට ඒක පිළිබඳ අපිට කෙලෙස් ඇති වෙන්නේ නෑ. නමුත් පසුව ඒක පිළිබඳව අපි තොරතුරු දැනගෙන ඒක පරිශීලනය කරලා මේකෙ අපිට ආශාව තණ්හාව ඇති වුනොත්, ඒක හිතේ ආසේවනය වුනොත්, පසුව අපිට ඒක දකිනකොට ඒක ආපසු සිහිවෙන කොටම අර තොරතුරු ඔක්කෝම එනවා. මෝඩකමට සිහි කර ගත්තු සියල්ලම එනවා. ඒ එන්නේ හුරුව නිසා. අන්න ඒ නිසා කෙනෙක් යම් ඇත්තටම අපිට මුලින් ගැටෙන්නේ ඇහැට පරමාර්ථවූ රූප ධර්මයක්. රූප ධර්මය නිසා අපි ඒ රූපය අරභයා පෙර අපි හුරු කරලා තියෙනවා නම් යම් විදියක්, අර රූපය ගැටෙන කොටම අර රූපය කෙරෙහි මුලා වෙනවා. එහෙනම් ඒ මෝඩ කමට හේතුව පෙර පුරුද්ද කියලා මේ විදියට අවිද්‍යාවට ඇතැම් වෙලාවට ආශ්‍රව හේතු වෙනවා කියලා බුදුරජාණන් වහන්සේ පෙන්නනවා. ඇතැම් වෙලාවට අපට කියන්න පුළුවන් මහණෙනි, මේ අවිද්‍යාවට හේතුව නීවරණ යි කියලා. හරි ඉතින් ඒ මනස ආවරණය වෙලා තියෙන නිසා මේ ඇත්ත නො පෙනෙන බව නේ නීවරණ කියලා කියන්නේ. ඉතින් නො පෙන්නනවා කියන ධර්මතාවයක් ලෝකයේ තියන නිසා, රූපයක් ගැටෙන කොට හැම වෙලාවේම ඒ රූපය කෙරෙහි වැරදි සංකල්ප උපදිනවා. නූපන් අවිද්‍යාව උපදිනවා. උපන් අවිද්‍යාව දියුණුවෙනවා කියන ධර්මතාවයක් තියෙනවා. අන්න ඒ විදියට අපට ඒක ගලපාගන්න පුළුවන්.

තෙරුවන් සරණයි.

(පිටකවරයේ ඇතුල්පැත්ත)

කෙනෙක් ධර්මය දැකගන්න තාක් කල් ඔහු කවදාවත් ධර්මයේ රසය ලබන්නේ නැහැ. පොතපතේ දැනුමෙන් තමන්ගේ චින්තාමය ඥානයෙන් වටහා ගත්තාට, මේක ප්‍රායෝගික ව අපි ඒ ඒ එන කෙලේසයට, එහෙම නැත්තම් අපිට හම්බෙන ආයතන ඔස්සේ අපිට හම්බවෙන දැකීම්, ඇහීම් ඔස්සේ මේ අවිද්‍යාව කියන එක මතුකරගෙන දුරු කර ගත්තෙ නැත්නම් ඔහුට කවදාවත් දුකෙන් මිදෙන්න බෑ. ඔහුට කවදාවත් ඒ කෙලෙස් වලින් මිදෙන්න පුළුවන් කමක් නෑ. ඒ නිසා දැනගත්ත පමණකින් බැහැ. ***ජානතො පස්සතො ආසවානං ඛයං වදාමි*** කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කළේ. දන්න කෙනාට දකින කෙනාට ආශ්‍රවක්ෂය වෙනවා කියලයි බුදුරජාණන්වහන්සේ දේශනා කළේ.